
# ඉතිහාසය

# 11 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

www.nie.lk



මුද්‍රණය සහ බෙදාහැරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

# 11 වන ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය සහ බෙදාහැරීම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඉතිහාසය
11 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : සිසාරා ප්‍රින්ට්වේ ප්‍රයිවට් ලිමිටඩ්
නො. 110,
පාගොඩ පාර,
පිටකෝට්ටේ.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියළු පාසල්වල සියළු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණිය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව
- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය
- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියළු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයත් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියළු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙදාහැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සද් කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2015.09.22

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **විෂය විශේෂඥ සභය** | |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය (බාහිර)** | |
| කේ.එස්. රංජනී | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| එච්.එම්. නලින් බණ්ඩාර | ගුරු සේවය<br>කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට |
| මේරි ඩොනේටා කන්‍යාසොයුරිය | විදුහල්පති සේවය (විශ්‍රාමික)<br>ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල |
| එම්.එච්.එම්.යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සී.එස්.කුමරප්පෙරුම | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර |
| **ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ඩබ්ලිව්.එස්.එස්. ගුණවර්ධන | සහකාර කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **භාෂා සංස්කරණය** | නියෝජ්‍ය නිදුහල්පති (විශ්‍රාමික)<br>ඩබ්.ඩී.කේ.ඩී.පිටිගල |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මක වන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාලපරිච්ඡේද තුනක් වෙන්කර ඇත.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිතය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විසිතුනක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විත ය.

ඉතිහාසය විෂය තුළින් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙහි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතාවන් අනුව මෙම ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකිය. මෙහි දී සැළකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂයේ අරමුණු ඉටුවන පරිදි අවම වශයෙන් 50%ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කිරීමයි.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටුකරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහිකිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අපවෙත යොමුකරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශය අන්තර්ගතය | x - xxi |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | |
| 11.1 කාර්මික විප්ලවය | 01 - 10 |
| 11.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම | 11 - 17 |
| 11.3 ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය | 18 - 22 |
| 11.4 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලනය | 23 - 25 |
| 11.5 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය | 26 - 32 |
| 11.6 ශ්‍රී ලංකාවට නිදහස ලැබීම | 33 - 39 |
| 11.7 ලෝකයේ කැපීපෙනෙන විප්ලව | 40 - 45 |
| 11.8 ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් | 46 - 54 |

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

## හැඳින්වීම

තම රටේ අනන්‍යතාව හඳුනාගනිමින් , ඒවා රැකගනිමින් ලෝක තත්ත්වයන්ට මුහුණ දිය හැකි දැහිතකාමී, ශක්තිමත් ශ්‍රී ලාංකික පුරවැසියකු බිහි කර ගැනීමේ අරමුණු පෙරදැරි කර ගෙන පාසල් විෂයමාලාවේ හර විෂයක් ලෙස ඉතිහාසය විෂය 2007 වසරේ සිට ක්‍රියාත්මක වේ.

මෙම අරමුණු වඩාත් පෝෂණය කරමින් වසර 2015 දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික පොදු අරමුණු සහ ජාතික පොදු නිපුණතා ද පාදක කර ගනිමින් ඉතිහාසය විෂයට අදාළ ව නිපුණතා විසිතුනක් යටතේ 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉතිහාසය විෂයමාලාව නිපුණතා පාදක ක්‍රමවේදය යටතේ සකස් කර ඇත.

11 වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙහි නිපුණතා අටක් යටතේ තේමා අටක් අධ්‍යයනය සඳහා ඉදිරිපත් කර ඇත. මෙම තේමා ශ්‍රී ලාංකික අනන්‍යතාව හා අපේ උරුමය පිළිබඳ අවබෝධ කර ගැනීමට ත් ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය හඳුනාගැනිමට ත් ඉඩ සලසා ඇත.

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

ix: III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම



තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා :
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය තුළින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනියි | **1.1 කාර්මික විප්ලවය හා එහි බලපෑම විග්‍රහ කරයි** | **1. කාර්මික විප්ලවය**<br>1.1 හැඳින්වීම<br>1.2 කාර්මික විප්ලවයේ ආරම්භය හා වර්ධනය<br>1.3 කාර්මික විප්ලවයේ ප්‍රබෝධය<br>1.4 කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම | • කාර්මික විප්ලවය හඳුන්වයි<br>• කාර්මික විප්ලවයේ නව නිමැවුම් විස්තර කරයි<br>• කාර්මික ප්ලවයේ ව්‍යාප්තිය පැහැදිලි කරයි<br>• කාර්මික විප්ලවයේ ප්‍රතිඵල විස්තර කරයි<br>• කාර්මික විප්ලවය ගෝලීය ප්‍රවණතාවක් ලෙස විග්‍රහ කරයි | 08 |
| රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි | **2.1 බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථිරවීම හා එහි ක්‍රියාකාරිත්වයේ ස්වරූපය විග්‍රහ කරයි** | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම**<br>2.1 බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීමේ පසුබිම<br>2.2 බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීම<br>2.3 බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම<br>- දූත ගමන්<br>- 1796 මුහුදුබඩ පළාත් යටත් කර ගැනීම<br>- 1815 උඩරට යටත් කර ගැනීම | • බ්‍රිතාන්‍යයන් ආසියාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පහදයි<br>• බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි<br>• බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවාගත් ආකාරය විස්තර කරයි | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **2.2 බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව පැන නැගුණ ස්වදේශීය ප්‍රතිවිරෝධතා පෙන්වා දෙයි** | 2.4 විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්<br>- 1818 නිදහස් සටන<br>* ඇතිවීමට තුඩුදුන් හේතු<br>* ස්වභාවය<br>* ප්‍රතිඵල<br>- 1848 නිදහස් සටන<br>* ඇතිවීමට තුඩුදුන් හේතු<br>* ස්වභාවය<br>* ප්‍රතිඵල | • බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව පැණ නැගුණ ස්වදේශික ප්‍රතිවිරෝධතා නම් කරයි<br>• ස්වදේශික ප්‍රතිවිරෝධතාවල ස්වභාවය හා ප්‍රතිඵල පැහැදිලි කරයි | |
| ශ්‍රී ලාංකේය සම්ප්‍රදාය හා සංස්කෘතිය රැකගැනීමට ක්‍රියා කළ නායකයින් අගයමින් එම ආදර්ශ චරිතායනය කර ගනියි | **3.1 විදේශීය බලවේග හමුවේ ජාතික නායකයින් ක්‍රියාකළ ආකාරය විග්‍රහ කරයි** | 3. **ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය**<br>3.1 ජාතික පුනරුදයේ පසුබිම<br>3.2 ආගමික පුනරුදය<br>- බෞද්ධ පුනරුදය<br>- හින්දු පුනරුදය<br>- ඉස්ලාම් පුනරුදය | • ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදයේ පසුබිම විස්තර කරයි<br>• ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදය හඳුන්වයි<br>• ආගමික සංස්කෘතික පුනරුදයට උරදුන් නායකයින් හඳුන්වා දෙයි<br>• ජාතික ගැටලුවල දී නායකයින්ගේ වගකීම පැහැදිලි කරයි | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ජාතික ව්‍යාපාරය ඇසුරින් ජාතික ඒකාබද්ධතාව සහ සාමග්‍රිය පවත්වාගෙන යාමේ වැදගත්කම මතු කර දක්වයි | **4.1 ආණ්ඩුක්‍රම විකාශනය හා ජාතික ව්‍යාපාරය විග්‍රහ කරයි** | **4. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්**<br>4.1 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ<br>4.2 1910 ප්‍රතිසංස්කරණ හා පසුබිම<br>4.3 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය<br>4.4 නිදහස සඳහා උද්ඝෝෂණ<br>- වාමාංශික ව්‍යාපාරය හා සූරිය මල් ව්‍යාපාරය<br>- අමාත්‍ය මණ්ඩලය සහ ජාතික සංගමය<br>- සෝල්බරි ආණ්ඩුක්‍රමය | • කෝල්බෲක් සිට සෝල්බරි දක්වා බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම විකාශනය පැහැදිලි කරයි<br>• අමද්‍යප ව්‍යාපාරයේ හා ජාතික ව්‍යාපාරයේ නැගීම විස්තර කරයි<br>• ජාතික ව්‍යාපාරය ආරම්භක අවදියේ ජාතික නායකයන්ගේ එක්සත්භාවය අගයයි<br>• ජාතික එක්සත්භාවය රැකගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි | 10 |
| ආගන්තුක සංස්කෘතික ධාරා දේශිය සමාජ ව්‍යුහයට අනුකූලනය වූ ආකාරය විග්‍රහ කරයි | **5.1 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි** | **5 . බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය**<br>හැඳින්වීම<br>5.1 ආර්ථික වෙනස්වීම්<br>- කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ<br>- ප්‍රතිසංස්කරණවල බලපෑම | • බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික වෙනස්වීම් පැහැදිලි කරයි<br>• බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික වෙනස්වීම් පැහැදිලි කරයි<br>• බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එක් වූ යහපත් හා අයහපත් ලක්ෂණ පෙන්වා දෙයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 5.2 සමාජ වෙනස්වීම්<br>- සමාජ<br>- සංස්කෘතික<br>5.3 බ්‍රිතාන්‍ය පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංග<br>5.4 අහිතකර බලපෑම් | | |
| නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය විමසා බලයි | **6.1 නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය විග්‍රහ කරයි**<br><br>**6.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග හා එහි ඵලදායීතාව විග්‍රහ කරයි** | **6. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම**<br>6.1 දේශපාලන<br>- සෝල්බරි ප්‍රතිසංස්කරණ හා නිදහස ලැබීම<br>- 1956 හා සමාජ පෙරළිය<br>- 1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම<br>- 1978 නව ආණ්ඩුක්‍රමය<br><br>6.2 නිදසින් පසු සංවර්ධන කටයුතු<br>- වාරිමාර්ග හා කෘෂිකර්මය<br>- කාර්මීකරණ ප්‍රතිපත්තිය<br>- අධ්‍යාපන<br>6.3 සමාජ සුබසාධනය | • නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම පැහැදිලි කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම සංශෝධන පැහැදිලි කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාමාර්ග පැහැදිලි කරයි<br>• සංවර්ධන ක්‍රියාමාර්ගවල ඵලදායිතාව පෙන්වා දෙයි<br>• සමාජ සුබසාධනය යනු කුමක්දැයි පැහැදිලි කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් විස්තර කරයි | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඓතිහාසික ගෝලීය දේශපාලන ප්‍රවණතාවල ආදර්ශ ආදේශනය කර ගනියි | **7.1 සාමුහික ව ක්‍රියාකිරීමෙන් තම අයිතීන් දිනා ගත හැකි බව ඇමෙරිකන් නිදහස් සටන ඇසුරින් පැහැදිලි කරයි**<br><br>**7.2 මූලික මිනිස් අයිතීන් ආරක්ෂා කර ගැනීමට ප්‍රංශවාසීන් ගෙන ගිය අරගලය විස්තර කරයි**<br><br>**7.3 සමාජ විෂමතා දුරු කර ගැනීම උදෙසා ගෙන ගිය රුසියානු විප්ලවය පැහැදිලි කරයි** | **7. ලෝකයේ කැපීපෙනෙන විප්ලව**<br>7.1 අමෙරිකන් නිදහස් සටන<br>- හැඳින්වීම<br>- බලපෑ හේතු<br>- ප්‍රතිඵල<br><br>7.2 ප්‍රංශ විප්ලවය<br>- හැඳින්වීම<br>- බලපෑ හේතු<br>- ප්‍රතිඵල<br><br>7.3 රුසියන් විප්ලවය<br>- හැඳින්වීම<br>- බලපෑ හේතු<br>- ප්‍රතිඵල | • අමෙරිකන් නිදහස් සටන පැහැදිලි කරයි<br>• අමෙරිකන් නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත්වන ආකාරය පෙන්වා දෙයි<br>• ප්‍රංශ විප්ලවය පැහැදිලි කරයි<br>• විප්ලවයෙන් දිනාගත් මූලික මිනිස් අයිතිවාසිකම් පෙන්වා දෙයි<br>• රුසියන් විප්ලවය පැහැදිලි කරයි<br>• විප්ලවයෙන් දිනාගත් සමාජවාදී සංකල්ප පැහැදිලි කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| නූතන ලෝකයේ දේශපාලන ගැටුම්වල ස්වභාවය විමසා බලා එවැනි ගැටුම් පිටුදැකීම සඳහා ආකල්පමය පරිවර්තනය ඇති කර ගනියි | **8.1 බලය පිළිබඳ ඇතිවන ගැටුම්වල විනාශකාරී බව විමසා බලයි** | **8. ලෝක මහා සංග්‍රාම හා සම්මුතින්**<br>8.1.1 පළමුවන ලෝක සංග්‍රාමය<br>8.1.2 ජාතීන්ගේ සංගමය<br>8.1.3 දෙවන ලෝක සංග්‍රාමය | • ලෝක සංග්‍රාම යනු කුමක්දැයි පැහැදිලි කරයි<br>• ලෝක සංග්‍රාමවලට හේතු විස්තර කරයි<br>• ලෝක යුද්ධවල විනාශකාරී බව පෙන්වා දෙයි | 14 |
| | **8.2 ගැටුම් නිරාකරණයේ දී ජාත්‍යන්තර සාමය බිහිවීම විග්‍රහ කරයි** | 8.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය | • එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳ හඳුන්වයි<br>• ලෝක සාමය රැකගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දායකත්වය පෙන්වා දෙයි<br>• වර්තමාන ලෝක සාමය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙයි | |

# 11.1 කාර්මික විප්ලව

මිනිස් දෑතේ සවියෙන් භාණ්ඩ නිෂ්පාදනය කාර්යක්ෂම කිරීමට නව යන්ත්‍ර සූත්‍ර සොයාගනිමින් කාර්මික හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති කළ ප්‍රබල වෙනස කාර්මික විප්ලවය ලෙස කෙටියෙන් හැඳින්විය හැකි ය. එතෙක් සුලු පරිමාණයෙන් නිපද වූ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර මගින් මහාපරිමාණයෙන් නිපදවීම දක්වා වර්ධනය වීම මෙම පරිවර්තනයේ සුවිශේෂ ලක්ෂණයකි. එංගලන්තය මූලික කරගෙන යුරෝපයෙන් ආරම්භ වූ මෙම තාක්ෂණික පරිවර්තනය පසු කාලය වන විට අනෙකුත් මහාද්වීප කරා ද ව්‍යාප්ත විය. දේශපාලන, ආර්ථික සහ සමාජ ආදී සෑම ක්‍ෂෙත්‍රයක ම පුළුල් වෙනස්කම් ඇති කිරීමට කාර්මික විප්ලවය බලපෑවේ ය. එයින් ඇති වූ ප්‍රතිඵල යහපත් මෙන් ම අයහපත් ඒවා ද විය. මෙම ඒකකය මගින් කාර්මික විප්ලවය ආරම්භවීම, එහි ස්වභාවය, ව්‍යාප්තිය හා කාර්මික විප්ලවයේ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කෙරේ.

**නිපුණතාව**

- ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි

**නිපුණතා මට්ටම** 1.1 කාර්මික විප්ලවය හා එහි බලපෑම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 05 යි**

**ඉගෙනුම් පල**

- කාර්මික විප්ලවය හඳුන්වයි
- කාර්මික විප්ලවයේ නව නිමැවුම් විස්තර කරයි
- කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය අන්තර්ගතය අනුව පාඩම සැලසුම්කර ගන්න

**11.1 කාර්මික විප්ලවය**

**1.1 හැඳින්වීම**

- මිනිසා දෑතේ සවියෙන් භාණ්ඩ නිපදවීම වෙනුවට නව යන්ත්‍ර සූත්‍ර සොයාගනිමින් කෙටි කාලයක් තුළ කාර්මික හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති කල ප්‍රබල වෙනස කාර්මික විප්ලවය ලෙස හැඳින්වේ.

පහත කරුණු සැලකිල්ලට ගනිමින් කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීම, ඊට බලපෑ හේතු, කාර්මික විප්ලවය නිසා විවිධ ක්ෂේත්‍රවල කෙටිකාලීනව ඇති වූ වෙනස්කම් කාර්මික හා තාක්ෂණික ප්‍රබෝධයේ ව්‍යාප්තිය, ප්‍රතිඵල හා ලංකාව කෙරෙහි එය බලපෑ ආකාරය සිසුන්ට පැහැදිලි කර දෙන්න

**1.2 කාර්මික විප්ලවයේ ආරම්භය හා වර්ධනය**

- 18 වන සියවස අගභාගයේ දී බ්‍රිතාන්‍ය තුළ කාර්මික විප්ලවය ආරම්භ වීම
- අඩසියවසක් පමණ යනතුරු කාර්මික විප්ලවය එංගලන්තයට සීමා වුවද, 19 වන සියවස වන විට යුරෝපයේ සෙසු රටවලට හා වෙනත් මහද්වීප කරා ද එය ව්‍යාප්ත වීම
- කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට හේතු
    - බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලන ස්ථාවරත්වය
    - වැඩවසම් ප්‍රවේණි ක්‍රමය බිඳවැටීම
    - ආකල්ප හා නව අදහස් ප්‍රචලිතවීම
    - මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් සිටීම
    - දියුණු බැංකු හා මුල්‍ය ආයතන බිහිවීම
    - අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම
    - ප්‍රවාහන පහසුකම්වල ව්‍යාප්තිය
    - යටත් විජිත හා වෙළෙඳාමේ වර්ධනය
    - ජනගහන වර්ධනය

**1.3 කාර්මික විප්ලවයේ ප්‍රබෝධය**

- **කාර්මික විප්ලවය ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර තුනක් ඔස්සේ වර්ධනය වීම**
    - පේෂකර්මාන්තය
    - ගල් අඟුරු කර්මාන්තය
    - යකඩ කර්මාන්තය
    - මෙම ක්ෂේත්‍රවල ඇති වූ වර්ධනය ක්‍රමයෙන් ප්‍රවාහන, සන්නිවේදන හා කෘෂිකර්මය ආදී ක්ෂේත්‍රවලට ව්‍යාප්ත වීම
- **පේෂකර්මාන්තය**
    - කාර්මික විප්ලවයට පෙර රෙදිපිළි නිෂ්පාදනය ගෘහාශ්‍රිත ව හස්ත කර්මාන්තයක් ලෙස පැවතීම
    - කාර්මික විප්ලවයේ දියුණුවත් සමඟ යන්ත්‍ර සූත්‍ර යොදවා මහාපරිමාන වශයෙන් රෙදිපිළි නිෂ්පාදනය වැඩි කළ හැකි තත්වයට නිෂ්පාදන කටයුතු දියුණු වීම
- ඒ සඳහා වූ නව සොයා ගැනීම්
    - 1733 ජෝන් කේ විසින් දුවන නඩාව නිපදවීම
    - එලියස් ගෝවේ නිපද වූ රෙදි මැසීමේ යන්ත්‍රය
    - ජේම්ස් හාග්‍රීව්ස්ගේ ජෙනී යන්ත්‍රය
    - රිචඩ් ආරක්රයිට්ගේ නූල් කටින යන්ත්‍රය
    - නව යන්ත්‍ර සූත්‍ර, විවිධ රෙදි මෝස්තර සැකසීම ආදී වශයෙන් දියුණු වූ පේෂකර්මාන්තයේ වර්ධනය අද දක්වාම විවිධ නව සොයා ගැනීම් අනුව සිදු වීම

**යකඩ හා වනේ කර්මාන්තය**

- පේෂකර්මාන්තය මෙන් වේගවත් සංවර්ධනයක් නොවුනත් බ්‍රිතාන්‍යයේ කාර්මිකරණයට ඉන් පෝෂණයක් ලැබීම
- බ්‍රිතාන්‍යයේ යපස් නිධි බහුල රටක් වීම
- කාර්මික විප්ලවයට පෙර බ්‍රිතාන්‍යයේ යකඩ හා වානේ නිපදවීම පැවති අතර, ඒවා අවි ආයුධ, ගෘහ උපකරණ හා කෘෂි උපකරණ තැනීම සඳහා යොදා ගෙන තිබීම
- යපස් උණු කිරීම සඳහා දර භාවිතා වීම
- ඒ සඳහා වූ නව සොයා ගැනීම්
    - ඒබ්‍රහම් ඩර්බි යපස් උණු කිරීම හා සඳහා ගල් අඟුරු යොදා ගැනීම වාත්තු කළ යකඩ නිපදවීම
    - හෙන්රි කෝට්ගේ රෝලර් යන්ත්‍රයෙන් පදම් කළ යකඩ නිපදවීම
    - හෙන්රි බෙස්මර්ගේ අපද්‍රව්‍ය ඉවත් කර වානේ නිපදවිය හැකි උඳුන
    - විවෘත උඳුන් ක්‍රමය - තත්වයෙන් උසස් වානේ නිපදවීම
    - විලියම් සීමන්ස්ගේ යපස් උණු කිරීම සඳහා විදුලි උඳුනක් නිපදවීම
    - වානේ කර්මාන්තය ඇසුරින් ආරම්භ වූ සොයා ගැනීම අද දක්වා සිදුවෙමින් පැවැතීම

**ගල් අඟුරු කර්මාන්තය (බලශක්තිය)**

- බ්‍රිතාන්‍ය ගල් අඟුරු හා ඛණිජ සම්පත් බහුල රටක් වීම
- කාර්මික විප්ලවයත් සමග ගල් අඟුරුවලට ඉල්ලුම වැඩි වීම
- ලාභදායී හා කාර්යක්ෂම බලශක්ති ප්‍රභවයක් ලෙස ගල් අඟුරු ජනප්‍රිය වීම
- එහෙත් ගල් අඟුරු කැනීම් කිරීම දුෂ්කර කාර්යයක් වීම
    - එක් රැස්වන ජලය ඉවත්කිරීම
    - ගල් අඟුරු ආකර පත්ල විෂවායු හා උණුසුම වැඩි වීම
- ඒ සඳහා වූ නව සොයා ගැනීම්
    - නිව්කොමන් ආකරවල ජලය ඉවත් කිරීම හා සිසිල් වාතය නල මගින් ආකරවලට යැවීමේ ක්‍රමයක් සොයා ගැනීම
    - ජේම්ස් වොට්ගේ වාෂ්ප එන්ජිම
    - හම්ප්‍රිඩේවිගේ 'ආරක්ෂක ලාම්පුව'
    - යකඩ කේබල් කම්බි මගින් ආකරවලින් ගල් අගුරු පිටතට ගෙන ඒමේ ක්‍රමයක් සොයා ගැනීම
    - ගල්අඟුරු කර්මාන්තයේ අතුරු ඵල ලෙස කර්මාන්ත රැසක් බිහිවීම නිසා ද මෙම කර්මාන්තය තවත් දියුණු වීම

      උදා :- මාහාමාර්ග ඉදිකිරීමට ගල්තාර භාවිතය, රෙදිපිළි සායම් වර්ග නිෂ්පාදනය, ඖෂධ, සුවඳවිලවුන්, තෙල් හා පොහොර නිෂ්පාදනය
    - වර්තමානයේ දී මෙම කර්මාන්තය සිදුවන අතර එහි නව සොයා ගැනීම් සිදුවෙමින් පැවතීම

**කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය**

- කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය දෙයාකාරයකින් සිදු වීම
    - වෙනත් ක්ෂේත්‍ර කරා ව්‍යාප්තිය
    - වෙනත් රටවල් කරා ව්‍යාප්තිය
- වෙනත් ක්ෂේත්‍ර කරා ව්‍යාප්තිය

  මේ යටතේ කෘෂිකර්මාන්තය, ප්‍රවාහන හා සන්නිවේදන යන ක්ෂේත්‍රයන් හි ව්‍යාප්තිය සිදු විය

**කෘෂිකර්මාන්තයෙහි ව්‍යාප්තිය**

* විවිධ යන්ත්‍ර භාවිතය
* මහාපරිමාණ ගොවිබිම්
* ශෂ්‍ය මාරු ක්‍රමය
* සත්ව පාලන කරටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම
* වැඩි අස්වැන්නක් ගතහැකි නව ක්‍රම පිළිබඳ පර්යේෂණ කිරීම
* මෙම කේෂත්‍රයේ වර්ධනය වර්තමානයේ ද සිදුවෙමින් පවතින නොනවතින ක්‍රියාවලියක් වීම

**ප්‍රවාහන කේෂත්‍රයේ ව්‍යාප්තිය**

- කර්මාන්තශාලාවලට අමුද්‍රව්‍ය හා වෙළෙඳපලට නිමි ද්‍රව්‍ය ප්‍රවාහනය කළ යුතු වූ යෙන් කාර්මිකරණය මෙම කේෂත්‍රය කරා බලපෑමක් ඇති කිරීම
- මේ සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර මෙන් ම මහාමර්ග පද්ධති ද අවශ්‍ය වීම
- ඒ අනුව බ්‍රිතාන්‍යයේ මහාමාර්ග, ඇලමාර්ග හා දුම්රිය මාර්ග ඉදිවීම
- පෞද්ගලික ව්‍යවසායකයින් මුදල් ආයෝජන කිරීම
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව සොයා ගැනීම
    - ජෝන් මැකඩම්ගේ **මැකඩම් ක්‍රමය**
    - රොබට් පුල්ටන්ගේ දුම් බෝට්ටුව
    - හෙන්රි බෙල් ගේ දුම් නැව
    - ජෝර්ජ් ස්ටීවන්සන්ගේ වාෂ්ප බලයෙන් ක්‍රියාකාරන දුම්රිය එන්ජිම
    - ඩෙම්ලර්ගේ මොටර් රථය
    - රයිට් සහෝදරයන්ගේ ගුවන්යානය
- මෙසේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ මාර්ග, දිය, ගොඩ, ගුවන ආදිය ජය ගනිමින් සීග්‍ර දියුණුවක් සිදු වීම හා එය වර්තමානයේ ද සිදු වන ක්‍රියාවලියක් වීම

**සන්නිවේදන ක්ෂේත්‍රයෙහි ව්‍යප්තිය**

- සන්නිවේදන ක්ෂේත්‍රයේ ද සීග්‍ර දියුණුවක් සිදු වීම
- ලෝකයේ ඕනෑම රටකට පැන්ස එකකින් ලිපියක් ගෙනයා හැකි තැපැල් සේවය
- සැමුවෙල් මෝස්ගේ විදුලි පණිවිඩ ක්‍රමය
- ග්‍රැහැම් බෙල් දුරකතනය නිපදවීම මිනිස් කටහඬ කම්බියක් දිගේ ගෙන යා හැකි ක්‍රමය

- ගුග්ලි මාර්කෝනිගේ ගුවන් විදුලි තරංග මගින් පණිවිඩ යැවීමේ ක්‍රමය
- ජෝන් ලොගි බෙයාඩ් විසින් රූපවාහිනිය සොයාගැනීම
- සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව වර්තමානය වනවිට විවිධ තාක්ෂණික අංගෝපාංග මගින් විශාල දියුණුවක් ලබා තිබීම හා එය තවදුරටත් සිදු වීම

- **වෙනත් රටවල් කරා ව්‍යාප්තිය**
  - එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය ඉතා ඉක්මනින් යුරෝපා මහාද්වීපයේ සෙසු රටවල මෙන් ම ආසියාවට ද ව්‍යාප්ත වීම
  - දහ නවවන සියවස වන විට ප්‍රංශය, ජර්මනිය යන රටවල අමුද්‍රව්‍ය හා වෙළෙඳපල පහසුකම් සහිත ප්‍රදේශවල කර්මාන්ත ආරම්භ වීම
  - ස්විට්සර්ලන්තය, ජර්මනියේ දකුණු ප්‍රදේශ කපු රෙදි නිෂ්පාදනයට ප්‍රසිද්ධ වීම
  - බෙල්ජියමේ වොලේනියා, ජර්මනියේ සයි ලුෂියා ප්‍රදේශ යකඩ නිෂ්පාදනයට ප්‍රසිද්ධ විය
  - දහනව වන සියවස වන විට බෙල්ජියම, ඕස්ට්‍රියාව, හන්ගේරියාව, ප්‍රෂියාව යන යුරෝපා රටවලත් අමෙරිකා එක්සත් ජනපදයේ හා ආසියාතික රටක් වූ ජපානයටද කාර්මික විප්ලවය ව්‍යාප්ත වීම
  - දහනව වන සියවසේ වෙනත් රටවල්වලට කාර්මිකරණය ව්‍යාප්ත වීමට බලපෑ හේතු
    - ලොව පුරා ජනගහණය සීඝ්‍රයෙන් වර්ධනය වීම නිසා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම
    - යුරෝපා මහාද්වීපය තුළ ගමනාගමනය හා ප්‍රවාහනය කටයුතුවල වර්ධනය
    - ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

ඉහත විෂය කරුණු ආවරණය වනසේ ඇමුණුම 01 හි සඳහන් ක්‍රියාකාරකම් සිසුන් ලවා කරවන්න

- මේවා කේවල ක්‍රියාකාරකම් ලෙස සිදුකරන්න
- ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කාලය ලබාදෙන්න
- ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදුකරන්න
- සෑම ක්‍රියාකාරකමක් ම ඇගයීම සිදු කරන්න
  (පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නම් පිළිතුරු සාකච්ඡා කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- කාර්මික විප්ලවය පිළිබඳ කරුණු අඩංගු පොත්පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඇමුණුම 01 හි සඳහන් ක්‍රියාකාරකම් සඳහා දී ඇති මාතෘකාව පිළිබඳ සිසුන්ගේ නිවැරදි විෂය දැනුම, අදාළ විෂය අන්තර්ගතය පිළිබඳ සිසු ආකල්ප සිසුන්ට දී ඇති ක්‍රියාකාරකම නිවැරදිව කිරීමේ හැකියාව (උදා:- රචනාවක් ලිවීම, පුවත්පතකට ලිපියක් ලිවීම, සිතියම් ලකුණු කිරීම ආදී . . . ) ක්‍රියාකාරකම් නිර්මාණශීල ව හා පිරිසිදු ව සිදු කිරීම, නියමිත කාලයට භාරදීම වැනි ලක්ෂණ මැනෙන සේ නිර්ණායක සකස් කරමින් ලකුණු පවරන්න

- සෑම ක්‍රියාකාරකමක් සඳහා ම ඉහත උපදෙස් අනුව නිර්ණායක සකස් කර ගන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

**ක්‍රියාකාරකම්**

1. කාර්මික විප්ලවය පාඩමට අදාළ කෙටිප්‍රශ්න අඩංගු පොතක් සකස් කිරීම (මේ සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න)

2. පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න
   - කාර්මික විප්ලවය හඳුන්වා දී එය බ්‍රිතාන්‍යයෙන් ආරම්භවීමට හේතු වූ කරුණු පහක් පැහැදිලි කරන්න
   - පේෂකර්මාන්තයේ ඇති වූ කාර්මික විප්ලවය පහත මාතෘකා අනුව පැහැදිලි කරන්න
     - පේෂකර්මාන්තයේ කාර්මීකරණයක් ඇතිවීමට හේතු
     - පේෂකර්මාන්තයේ නව නිමැවුම් හා ඉන් සිදුවූ සේවය
     - පේෂකර්මාන්තයේ කාර්මීකරණය නොනවතිමින් සිදු වීම
   - යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ කාර්මික විප්ලවය පහත මාතෘකා අනුව පැහැදිලි කරන්න
     - යකඩ හා වානේ කර්මාන්තයේ කාර්මීකරණයක් ඇති වීමට හේතු
     - යකඩ හා වානේ කර්මාන්තයේ නව නිමැවුම් හා ඉන් සිදු වූ සේවය
     - යකඩ හා වනේ කර්මාන්තයේ කාර්මීකරණය නොනවතිමින් සිදු වීම
   - ගල් අඟුරු කර්මාන්තයේ ඇති වූ කාර්මික විප්ලවය පහත මාතෘකා අනුව පැහැදිලි කරන්න
     - ගල් අඟුරු කර්මාන්තයේ කාර්මීකරණයක් ඇතිවීමට හේතු
     - ගල් අඟුරු කර්මාන්තයේ නව නිමැවුම් හා ඉටු වූ සේවය
     - ගල් අඟුරු කර්මාන්තයේ කාර්මීකරණය නොනවතිමින් සිදු වීම

3. කාර්මික විප්ලවයට අදාළ ව පහත සඳහන් මාතෘකා යටතේ පුවත්පතකට ලිපි සකස් කරන්න
   - "සන්නිවේදන කේෂත්‍රයේ දියුණුව නොනවතින ක්‍රියාවලියකි"
   - සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව එදා සහ අද

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව එදා සහ අද
- කෘෂිකර්මික දියුණුව එදා සහ අද

4. කාර්මික විප්ලවය ආරම්භවී ව්‍යාප්ත වූ පහත සඳහන් රටවල් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න
   - එංගලන්තය, ජර්මනිය, ප්‍රංශය, ස්විස්ර්ලන්තය, බෙල්ජියම, ඔස්ට්‍රියාව, හන්ගේරියාව, ප්‍රෂියාව, අමෙරිකා එක්සත් ජනපදය, ජපානය

**නිපුණතා මට්ටම** 1.2 කාර්මික විප්ලවය හා එහි බලපෑම විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** 02 යි

**ඉගෙනුම් පල** • කාර්මික විප්ලවයේ ප්‍රතිඵල විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් අන්තර්ගතය අනුව පාඩම සැලසුම් කර ගන්න

- කාර්මික විප්ලවය නිසා දේශපාලන, ආර්ථික, සමාජ ක්ෂේත්‍රවල වෙනස්කම් රාශියක් ඇති වීම
- ලොව පුරා ඇති වූ මෙම වෙනස්කම් යහපත් මෙන් ම අයහපත් ලක්ෂණවලින් ද සමන්විත වීම
- දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්
    - ධනපති පන්තිය හා නිර්ධන පන්තිය බිහිවීම
    - විවිධ දේශපාලන දර්ශන බිහි වීම
      උදාඃ- සමාජවාදය, ලිබරල්වාදය
    - යටත්විජිත අල්ලා ගැනීමේ තරගය
    - කම්කරු උද්ඝෝෂණ සහ වෘත්තිය සංගම් බිහිවීම
- ආර්ථික ක්ෂේත්‍රයේ ඇතිකළ වෙනස්කම්
    - කාර්මික නිෂ්පාදන පුළුල් වීම
    - වෙළෙඳ පන්තිය හා කම්හල් හිමි ධනපති පන්තියක් බිහි වීම
    - ධනවාදී ආර්ථික ක්‍රමය
    - වැටුප මත ජීවත්වන පිරිසක් බිහි වීම
    - බැංකු කටයුතු හා රක්ෂණ ක්‍රම දියුණු වීම
    - බද්ධ ව්‍යාපාර බිහි වීම
    - ආනයන, අපනයන වෙළෙඳාම
- සමාජ ක්ෂේත්‍රයේ ඇතිකළ බලපෑම
    - නගර බිහිවීම හා නගර ජනාකීර්ණ වීම
    - පන්ති සහිත සමාජයක් බිහි වීම
    - කම්කරුවන්ගේ සුභසාධනය ක්‍රමයෙන් දියුණු වීම
    - පරිසරය දූෂණය

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 01 හි ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට සිසුන් යොමු කරන්න
- පන්ති කාමරය තුළදීම පිළිතුරු ලබාගන්න
- පිළිතුරු ඇගයීමට ලක් කරන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

1. කාර්මික විප්ලවය නිසා දේශපාලන කේෂත්‍රයේ ඇති වූ වෙනස්කම තුනක් සඳහන් කරන්න
2. ආර්ථික කෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න
3. සමාජ කෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- කාර්මීකරණයේ ප්‍රතිඵල සඳහන් කරයි
- ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයයි
- කාර්මීකරණයේ යහපත් ප්‍රතිඵල අගය කරයි
- නියමිත කාලයට නිම කරයි
- සහයෝගයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** 1.3 කාර්මික විප්ලවය හා එහි බලපෑම විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** 01 යි

**ඉගෙනුම් පල**
- කාර්මික විප්ලවය ගෝලීය ප්‍රවණතාවයක් ලෙස විග්‍රහ කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් අන්තර්ගතය අනුව පාඩම සැලසුම් කර ගන්න

**කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම**

- ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට යටත් වීම හේතුකොට ගෙන කාර්මික විප්ලවයේ බලපෑම් වලට නතු වීම
    - මහා පරිමාණ වගාබිම් - වතු වගාව ව්‍යාප්ත වීම
    - කර්මාන්ත හා ඒවායෙහි විවිධ යන්ත්‍ර සූත්‍ර භාවිතය
    - වතු හිමියන් ධනපතීන් වීම
    - වැටුපට වැඩකරන කම්කරු පන්තියක් බිහි වීම
    - තැපැල් සේවය ආරම්භ වීම
    - මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදි වීම
    - බැංකු ක්‍රම ආරම්භ වීම

**ගුණාත්මක යෙදවුම්**

- ක්‍රියාකාරකමට උචිත පරිදි සකසාගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ක්‍රියකාරකට උචිත පරිදි ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ගන්න

## 11.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

වෙළෙඳාම දියුණු කර ගැනීමත් යටත් විජිත බිහිකර ගැනීමටත්, ආගම ප්‍රචාරය කිරීමත්, යනාදී අරමුණු පෙරදැරි කරගෙන යුරෝපා ජාතිහු පෙරදිග පැමිණියහ. ක්‍රි.ව. 1796 දී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ලන්දේසින්ගෙන් පවරා ගත් ඉංග්‍රීසි ජාතිකයෝ 1815 වන විට මුළු රටම තම ආධිපත්‍යයට නතු කර ගත්හ. ශ්‍රී ලංකාවේ තම ආධිපත්‍යය පතුරුවා ගැනීමට බ්‍රිතාන්‍යන් ගෙනගිය ක්‍රියා කලාපය පිළිබඳවත් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් යලි නිදහස් වීමට දියත් කළ නිදහස් සටන් පිළිබඳවත්, ලාංකිකයන්ගේ උද්ඝෝෂණ නිසා පාලන ක්‍රමයේ සිදු වු වෙනස්කම් පිළිබඳවත් මෙම ඒකකයෙන් අධ්‍යයනය කළ හැකි වේ.

**නිපුණතාව** • රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි

**නිපුණතා මට්ටම** 2.1 බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථිරවීම හා එහි ක්‍රියාකාරිත්වයේ ස්වරූපය විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 05 යි**

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන් ආසියාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පහදයි
- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි
- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවාගත් ආකාරය විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගැනීමට කටයුතු කරන්න

**11.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම**

**2.1 බ්‍රිතාන්‍යයන් ආසියාවට යොමු වීමේ පසුබිම**

- ආසියානු වෙළඳාම පිළිබඳ තරගය
- යටත් විජිත පිහිටුවා ගැනීමේ බල තරගය

**2.2 ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු වීමට හේතු**

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ නැව් මාර්ගයන්හි මධ්‍යගතව පිහිටු වීම
- ඊසාන දිග සහ නිරිත දිග මෝසම් සුළං කාලවලදී ආරක්ෂා සහිත ව නැව් නවතා තැබිය හැකි ස්වාභාවික වරායක් පිහිටා තිබීම
  උදා :- ත්‍රිකුණාමලවරායේ තිබු වැදගත්කම
- ලංකාවේ සිට ඉන්දියාවේ බටහිර සහ නැගෙනහිර වෙරළේ නාවුක බලය පහසුවෙන් පාලනය කළ හැකි වීම
- ලංකාවේ තිබු වෙළඳ ද්‍රව්‍යවල වටිනාකම උදාඃ- කරුඳු

2.3 බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

**දූතගමන්**

- ක්‍රි.ව. 1762 දී ජෝන් ෆයිබස් ප්‍රමුඛ ඉංග්‍රීසි දූත පිරිසක් මහනුවරට ගොස් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීම
- ක්‍රි.ව. 1782 දී හියුබොයිඩ්ගේ නායකත්වය යටතේ දෙවන වරටත් ඉංග්‍රීසින් උඩරට රජුවෙත දූත පිරිසක් එවීම
- 1795 රොබට් ඇන්ඩෘස් උඩරටට පැමිණීම

**1796 මුහුදු බඩ බලය පිහිටු වීම**

**බලය පිහිටුවීමේ පසුබිම**

- ක්‍රි.ව. 1794 දී ප්‍රංශය ඕලන්දය ආක්‍රමණය කිරීම හා ඕලන්ද පාලකයා ස්ටැට්හෝල්ඩර් (5 වන විලියම් කුමරු) එංගලන්තයට පලා යාම
- ස්ටැට්හෝල්ඩර්වරයා **කියු මාලිගයේ** සිට ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරවරයා වෙත "කියු" ලිපිය යැවීම
- කියු ලිපිය අනුව ලන්දේසි පාලන ප්‍රදේශ ඉංග්‍රීසින්ට පවරා දීමට එවක ලන්දේසි ආණ්ඩුකාරවරයා (ෆන් එංගලන්බෙක්) අකමැති වීම
- ඉංග්‍රීසින් ක්‍රි. ව. 1795 අගොස්තු මාසයේ දී ලන්දේසින්ට පහර දී ත්‍රිකුණාමලවරාය අල්ලා ගැනීම
- අනතුරුව පිළිවෙළින් යාපනය, මන්නාරම, කල්පිටිය හා කොළඹ අත්පත් කර ගැනීම
- ලන්දේසින් සතුව තිබූ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ෆන් එංගල්බෙක් ආණ්ඩුකරු ඉංග්‍රීසි පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගමට පවරා දීමේ ගිවිසුම අත්සන් කිරීම
- (ක්‍රි.ව. 1796 - 1798 දක්වා) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට පවරා ගත් මුහුදු බඩ ප්‍රදේශ එම සමාගමේ මදුරාසි පාලන මධ්‍යස්ථානය මගින් පාලනය කිරීම
- ඉංග්‍රීසි වෙළෙඳ සමාගම මෙරට මුහුදු බඩ ප්‍රදේශවල ක්‍රියාත්මක කළ බදු ප්‍රතිපත්තියට එරෙහිව කැරැල්ලක් ඇති වීම
- ක්‍රි.ව. 1802 දී ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පාලනය සම්පූර්ණයෙන්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට පවරා ගැනීම
- 1798 - 1802 කාලයේ මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ද්විත්ව පාලනයන් ක්‍රියාත්මක වීම

**ක්‍රි. ව. 1815 උඩරට යටත් කර ගැනීම**

- නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ කාලයේ උඩරට යටත් කර ගැනීමේ ආක්‍රමණයක් සිදු කළත් එය අසාර්ථක වීම
- ක්‍රි.ව. 1805 දී පත්ව ආ තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා ජෝන් ඩොයිලිගේ උදව් ඇති ව උඩරට අල්ලා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය නිසා භික්ෂුන්වහන්සේලා, රදළ ප්‍රධානීන් හා මහජනතාව රජු ගැන අප්‍රසාදයෙන් පසු වීම
- පහත රටින් උඩරට බලා ගිය වෙළෙඳ පිරිසකට රජු දරුණු දඬුවම් පැණවීම හේතු කරගෙන ඉංග්‍රීසින් 1815 දී උඩරට ආක්‍රමණය කිරීම
- සිංහල නායකයින් විසින් උඩරට රජු අල්ලාගෙන ඉංග්‍රීසි හමුදාවට භාරදීම
- 1815 මාර්තු 02 දින මහනුවර මඟුල් මඩුවේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීම හා උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වීම

**ඉහත විෂය අන්තර්ගතය ආවරණයවන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- ක්‍රි.ව. 1796 සිට බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය යටත් කර ගැනීම දක්වා ඓතිහාසික කරුණු එක්රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සැකසීම
  - මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
  - පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න
  - බ්‍රිතාන්‍ය බලය පිහිටුවීමට අදාල පාඩම සිසු කණ්ඩායම්වලට කියවා ගැනීමට අවස්ථාව දෙන්න
  - සෑම කණ්ඩායමක් විසින්ම ඇමුණුම 01 හි මාතෘකා අනුව පෙළපොත ඇසුරින් කෙටි ප්‍රශ්න සැකසීමට උපදෙස් දෙන්න
  - මේ සඳහා කාලපරිච්ඡේද 02 ලබා දෙන්න
  - ප්‍රශ්නාවලිය පන්තියේ සියලුදෙනාටම පරිහරණය කිරීමට සුදුසු ලෙස තැබීමට හැකි වන පොතක් ලෙස සකස් කිරීමට උපදෙස් දෙන්න
  - මාතෘකා පිළිබඳ අර්ථවත් ප්‍රශ්න නිර්මාණයට හා එයට අදාළ පිළිතුරු ද සකස් කිරීමට උපදෙස් දෙන්න (ප්‍රශ්න එක් වර්ණයකින් හා පිළිතුරු තවත් වර්ණයකින් ලිවීම වඩා උචිත බවට උපදෙස් දෙන්න)
  - ක්‍රියාකාරකම ඇගයීමට ලක්කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- සකස්කළ ප්‍රශ්න හා පිළිතුරු මාතෘකාවලට උචිත ව සකසයි
- ප්‍රශ්නවල වලංගුතාව හා නිවැරදි බව සුරකියි
- කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කරයි
- ප්‍රශ්නෝත්තර පොතක් නිර්මාණය කරයි

**ගුණාත්මක යෙදවුම්**

කුඩා කොපි පොතක් (පිටු 40)

ඇමුණුම 01

පහත මාතෘකා අනුව ප්‍රශ්න හා පිළිතුරු සකස් කරන්න

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීමට අදාළ පහත සඳහන් මාතෘකාවලට අනුව සෑම කණ්ඩායමක් ම මාතෘකා සියල්ලම ආවරණය වන පරිදි ප්‍රශ්න සැකසීම සිදු කරන්න.
  - බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීමේ පසු බිම
  - බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීම
  - ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම

**නිපුණතා මට්ටම** 2.2 බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව පැණ නැගුණ ස්වදේශීය ප්‍රතිවිරෝධා පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවः 07 යි**

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව පැණ නැගුණ ස්වදේශික ප්‍රතිවිරෝධතා නම් කරයි
- ස්වදේශික ප්‍රතිවිරෝධතාවල ස්වභාවය හා ප්‍රතිඵල පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ආවරණය වනසේ පාඩම සැලසුම් කර ගන්න.

**2.4 විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්**

**1818 නිදහස් සටන**

**1818 සටනට තුඩුදුන් හේතු**

- රජෙකු නැතිවීමේ සාංකාව හා තමන්ගේ ම රජෙකු පත්කර ගැනීමේ අවශ්‍යතාව
- ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරටියන් තුළ පැවති කලකිරීම
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු පැවතීම
- උඩරට ප්‍රභූ පන්තියේ තත්වයට හා ආදායම් මාර්ගවලට පහර වැදීම
- මඩිගේ මොහන්දිරන් තනතුරට හජ්ජි මරික්කාර් පත් කිරීම

**1818 සටනේ ස්වභාවය**

- රාජ්‍ය ප්‍රතිරූපකයා වශයෙන් දොරේසාමි ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ සටන් කාමීන් හා එකතු වීම
- බදුල්ල උප ඒජන්තවරයාට සටන්කාමීන් මර්දනය කළ නොහැකි වීම
- කැප්පෙටිපොළ ඇතුලු නායකයින් සටනට එකතු වීම
- සටනේ ව්‍යාප්තිය
- ඉංග්‍රීසින් එල්ල කළ මර්දනයේ ස්වභාවය
- සටන අසාර්ථක වීම (නායකයන් අත් අඩංගුවට පත් වීම)

**1818 පළමු නිදහස් සටන අසාර්ථක වීමට හේතු**

- සටන මැනවින් සංවිධානය වී නොතිබීම (එක් එක් ප්‍රාදේශීය නායකයන් අතර මනා සංවිධානයක් නොතිබීම)
- දළඳා වහන්සේ බ්‍රිතාන්‍යයන් සතු වීම
- රදළයන් අතර වූ පෞද්ගලික එදිරිවාදිකම්
- ඉංග්‍රීසීන් අනුගමනය කළ බිම් පාළු ප්‍රතිපත්තිය (ගම්බිම්වල වගාවන් විනාශ කිරීම)
- දොරේසාමි නැමැත්තා සිහසුනට උරුමකරුවෙකු නොවන බව හෙළි වීම
- ස්වදේශිකයන්ට නවීන අවිආයුධවලට මුහුණ දීමට නොහැකි වීම
- 1818 සැප්තැම්බර් 21 දිනට පෙර සිය කැමැත්තෙන් යටත්වන අයට නිදහස දෙන බවට බ්‍රිතාන්‍ය ආණ්ඩුව නිවේදනය කිරීම

1818 නිදහස් සටනේ ප්‍රතිඵල

- ඉංග්‍රීසි ආණ්ඩුවේ දරුණු මර්දනයකට උඩරැටියන් ඉලක්ක වීම
- කැරළි නායකයින් වූ කැප්පෙටිපොළ හා මඩුගල්ලේ රාජද්‍රෝහීන් ලෙස සලකා මහනුවර බෝගම්බරදී හිසගසා මරණයට පත් කිරීම
- අනෙකුත් නායකයන් රටින් පිටුවහල් කිරීම හා දේපළ රාජසන්තක කිරීම

1818 ප්‍රකාශනය නිකුත් කිරීම

- එම ප්‍රකාශනය අනුව රදළවරුන්ගේ බලතල අඩු කීරීම
  උදාඃ- උඩරට දේශීය නිලධාරීන්ට සුළු මුලාදෑනීන් පත් කිරීමට තිබු බලය අහෝසි කිරීම
- ආණ්ඩුකාරයාගේ අවසරය මත උඩරට වෙනත් ආගම් ප්‍රචාරයට ඉඩ ලබා දීම
- උඩරට රදළයින් බ්‍රිතාන්‍යයන්ගෙන් වැටුප් ලබන පිරිසක් බවට පත්වීම
  උඩරට දේශීය නිලධාරීන්ට මහජනයාගෙන් පුදපඬුරු ලබා ගැනීමට
- අවසර නැති බව ප්‍රකාශ කිරීම
- ඉංග්‍රීසින්ගේ උසාවි ක්‍රමය උඩරට ප්‍රදේශවල ද පිහිටු වීම

1848 දෙවන නිදහස් සටන

- කෝල්බෲක් කොමිසමේ නිර්දේශය පරිදි 1833 ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල 1848 දෙවන නිදහස් අරගලයට පසු බිම සැකසීම

1848 නිදහස් සටනට තුඩුදුන් හේතු

- සිවිල් සේවයේ ඇති වූ බිඳවැටීම හා ආණ්ඩුව හා ජනතාව අතර සබඳතාවය අඩු වීම
- දේශීය කෘෂිකාර්මික කටයුතුවලට රජයේ අනුග්‍රහය නොලැබීම
- දිස්ත්‍රික්ක උසාවි ක්‍රමයෙන් ගැමියා පීඩාවට පත් වීම
- ස්ටුවර්ට් මැකන්සි ආණ්ඩුකාරයා විසින් 1840 පනවන ලද මුඩුබිම් ආඥාපනත
- බුදු දහමට රජයේ අනුග්‍රහය ලබා දීම අත් හැරීම
- ටොරිංටන් ආණ්ඩුකාරයාගේ නව බදු ප්‍රතිපත්තිය
- නිල්පොත නැමති සංඛ්‍යාලේඛන සංග්‍රහයට කරුණු රැස්කිරීම පිළිබඳ ජනතාව තුල තිබු සැකය

සටනේ ස්වභාවය

- උඩරැටියන් බ්‍රිතාන්‍ය පාලකයින්ට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ගිය අවස්ථාවේ ඇති වූ කලබලකාරී තත්ත්වය හමුවේ ආණ්ඩුකාරය යුද්ධ නීතිය පැනවීම
- මාතලෙන් ඇරඹී සටන මහනුවර, දඹුල්ල, වාරියපොළ හා කුරුණෑගල යන ප්‍රදේශවල ශීඝ්‍රයෙන් පැතිරීම

- 1848 නිදහස් සටනේ නායකත්වය ගත් අය
- වීරපුරන් අප්පු
- ගොන්ගාලේගොඩ බණ්ඩා
- හඟුරන්කෙත ඩිංගිරාල
- දිනෙස්
- නිදහස් සටන අසාර්ථක වීම

**1848 දෙවන නිදහස් සටන අසාර්ථක වීමට හේතු**

- සටන මනාව සංවිධානය වී නොතිබීම හා අත්දැකීම් මදිකම
- උඩරට පුරා සතුටු දායක මට්ටමේ මාර්ග පද්ධතියක් පැතිර තිබීම
- ඉංග්‍රීසින්ට අවශ්‍ය අවස්ථාවේ දී අතිරේක සේනා ලැබීම
- සිංහලයන්ට නවීන අවිආයුධ හා පුහුණු හමුදාවක් නොතිබීම

**1848 සටනේ ප්‍රතිඵල**

- ටොරිංටන් ආණ්ඩුකාරයා සහ එකල සිටි යටත් විජිතයේ ලේකම් වූ එමර්සන් ටෙනන්ට් ආපසු එංගලන්තයට කැඳවීම
- වැරදිකරුවන් ලෙස ඔප්පු වූ අයට දඬුවම් දීම හා දේපල රජසන්තක කිරීමට පියවර ගැනීම
- ජනතාවගේ විරෝධයට ලක් වූ සමහර බදු වර්ග (කඩසාප්පු බද්ද, සුනඛ බද්ද) අවලංගු කිරීම
- සමහර බදු වර්ග සංශෝධනය කිරීම (මුද්දර බද්ද, තුවක්කු බද්ද, කරත්ත බද්ද, බෝට්ටු බද්ද, ඇඟ බද්ද)
- ගොවි ජනතාව කෙරෙහි දැක් වූ සැලකිල්ල ප්‍රමාණවත් නොවන බව බ්‍රිතාන්‍ය පාලකයින් අවබෝධ කර ගැනීම ඒ නිසා කෘෂිකාර්මාන්තය හා වාරිකර්මාන්තය දියුණු කිරීම රජයේ අනුග්‍රහය ලබා දීම
- වතු වගාවට අවශ්‍ය මාර්ග ඉදිරිකිරීම සහ ප්‍රාදේශිය හා පළාත් පාලන කටයුතු වැඩිදියුණු කිරීමට 1852 පසු පාලකයන්ට නියම කිරීම
  උදා :- මහ නගර සභා ගම්සභා පිහිටුවීම
- බදු අවලංගු කිරීම සංශෝධනය කිරීම කෘෂිකර්මය හා වාරිකර්මාන්තය දියුණු කිරීමට පියවර ගැනීම තුළින් පෙනී යන්නේ මෙම සටන යුක්ති සහගත එකක් වූ බව බ්‍රිතාන්‍ය පාලකයන් පවා පිළිගත් බවයි.

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ක්‍රි.ව 1818 හා 1848 නිදහස් අරගල පිළිබඳ වගුවක් සකස් කිරීම**

- මේ සඳහා එක් කාලච්ඡේදයක් ලබාදෙන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01හි සඳහන් වගුව බ්‍රිස්ටල් බෝඩ් එකක හෝ ඒ සමාන කඩදාසියක පිටපත් කර ගන්න

- පෙළපොත සහ වෙනත් මූලාශ්‍රය අධ්‍යයනය කර වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- සම්පූර්ණ කළ වගු බිත්තියේ ප්‍රදර්ශනය කර ඇගයීම සිදු කරන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 01 වගුව

බ්‍රිස්ටල් බෝඩ්

ෆෙල්ට් පෑන්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- 1818 හා 1848 නිදහස් අරගල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- වගුව නිවැරදි ව සම්පූර්ණ කරයි
- නිදහස් සටනේ නායකයින් පිළිබඳ ව අගයයි
- නියමිත වේලාවට කාර්යය නිම කරයි
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට සහයෝගය දක්වයි

ඇමුණුම 1 වගුව

| වර්ෂය | සටනට බලපෑ හේතු | සටනේ නායකයෝ | සටනේ ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |

## 11.3 ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

19වන සියවසේ මුල් භාගයේ මෙරටට පැමිණි විවිධ මිෂනාරි සංවිධාන තම ආගම පැතිරවීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා දිවයිනේ බෞද්ධ, හින්දු හා ඉස්ලාම් යන දේශීය ජනතාව අතර ආගමික පිබිදීමක් ඇතිවිය. එය ආගමික හා ජාතික පුනරුදය ලෙස හැදින්විය හැකිය.

**නිපුණතාව** • ශ්‍රී ලාංකේය සම්ප්‍රදාය, සංස්කෘතිය රැක ගැනීමට ක්‍රියාකළ නායකයින් අගයමින් එම ආදර්ශ චරිතායනය කර ගනියි

**නිපුණතා මට්ටම** 3.1 විදේශීය බලවේග හමුවේ ජාතික නායකයින් ක්‍රියාකළ ආකාරය විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 07 යි**

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය විස්තර කරයි
- ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට උරදුන් නායකයින් හඳුන්වා දෙයි
- ජාතික ගැටලුවලදී නායකයින්ගේ වගකීම පැහැදිලි කරයි

**3.1 ආගමික හා සංස්කෘතික පුනරුදයේ පසුබිම**

19වන සියවසේ මුල් භාගයේ මෙරටට පැමිණි විවිධ මිෂනාරි සංවිධාන ස්වකීය ආගම රට තුළ පැතිරවීමට ප්‍රධාන මාර්ග තුනක් අනුගමනය කර ඇත

**ලේඛනය** - විවිධ පුවත්පත්, පොත්පත් හා සඟරා මුද්‍රණය කර මහජනතාව අතර බෙදාහැරීම. (මාසික තෑග්ග, උරගල, ලංකා නිධානය වැනි සඟරා)

**දේශනය** - මහජනතාව රැස්වන ස්ථානවලට පැමිණ දේශන, සාකච්ඡා ආදිය මගින් ආගම පැතිරවීම

**අධ්‍යාපනය** ආගම පැතිරවීම වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වූයේ අධ්‍යාපනයයි. මේ නිසා බොහෝ මිෂනාරී සංවිධාන පාසැල් ඉදිකිරීම, පාසැල් පවත්වාගෙන යාම තම වගකීමක් ලෙස සලකා ක්‍රියා කර ඇත

ආගමික පුනරුද ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණය වූයේ මෙරට බෞද්ධ, හින්දු හා ඉස්ලාම් භක්තිකයන් ලේඛන, දේශනය, අධ්‍යාපනය යන මාර්ග ඔස්සේ මිෂනාරීන්ට ප්‍රතික්‍රියා දැක්වීමයි. රටේ බහුතර ජනතාව වූ බෞද්ධයන්ගේ ආගමික පුනරුද ව්‍යාපාරය මේ අතරින් කැපී පෙනිණ.

**බෞද්ධ පුනරුද ව්‍යාපාරය**

පානදුර වලානේ ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන, රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන පිහිටුවීම නිසා එම පිරිවෙන් තුළින් ගිහි පැවිදි උගතුන් පිරිසක් බිහි විය. එම උගතුන් මුල් වී 1873 දී විද්‍යෝදය පිරිවෙන හා 1875 දී පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීමත් නිසා බිහිවූ උගතුන් බෞද්ධ පුනරුද ව්‍යාපාර කටයුතුවලට නායකත්වය දීමට ඉදිරිපත් විය.

**ලේඛන මාධ්‍යයෙන් ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම**

**මුද්‍රණාල පිහිටුවීම**

- ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
- සරසවි සඳරැස මුද්‍රණාලය, සුදර්ශන මුද්‍රණාලය, කවට කථිකයා මුද්‍රණාලය ආදී සෙසු මුද්‍රණාල පිහිටුවීම
- පුවත්පත් හා සඟරා මුද්‍රණය කරවීම
    * ලක්මිණිපහන පුවත්පත
    * සරසවි සඳරැස පුවත්පත
    * වෙනත් පුවත්පත් හා සඟරා
- පුවත්පත් හා සඟරා මගින් වාද විවාද පැවැත්වීම

**දේශන මාධ්‍යය**

- ආගම පැතිරවීමේ මාර්ගයක් වශයෙන් මිෂනාරීන් දේශන මාධ්‍ය යොදාගැනීම බෞද්ධයන් ද එම මාධ්‍යයම යොදාගෙන මිෂනාරීන්ට පිළිතුරු දීම
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් පංචමහාවාද පැවැත්වීම උදාහරණ : 1873 පානදුරාවාදය

**අධ්‍යාපන මාධ්‍යය**

- හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ පැමිණීම, පරමවිඥානාර්ථ සමාගම ආරම්භ කිරීම හා බෞද්ධ පාසැල් අරමුදලක් පිහිටුවීම
- මෙම අරමුදලට ආධාර ලබාගැනීමට ඕල්කට්තුමා හා භික්ෂුන් වහන්සේලා රටපුරා සංචාරය කිරීම
- බෞද්ධ පාසල් පිහිටුවීම
    කොළඹ ආනන්ද විද්‍යාලය
    මාතලේ විජය විද්‍යාලය
    ගාල්ලේ මහින්ද විද්‍යාලය
    මහනුවර ධර්මරාජ විද්‍යාලය
    නාවලපිටිය අනුරුද්ධ විද්‍යාලය ආදිය
- 1900 වන විට මෙබඳු පාසල් රැසක් පිහිටුවීමට හැකියාව ලැබීම

**බෞද්ධ පුනරුද ව්‍යාපාරය තුළින් බිහි වු දේශාභිමානි ව්‍යාපාර**

19වන සියවසේ අවසානය වන විට බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ කටයුතු මිෂනාරීන්ගේ කටයුතුවලට ප්‍රති උත්තරදීමෙන් ඔබ්බට ව්‍යාප්ත වී තවත් ව්‍යාපාර තුනක් බිහිවිය.

1. **ස්වදේශිකයන් අතර ජාත්‍යාලය දනවීමේ ව්‍යාපාරය**

   පියදාස සිරිසේන මහතා තම නව කථා හා සිංහල ජාතිය පුවත්පත ආදිය මගින් මේ සඳහා කැප විය. අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා වැනි ගිහි නායකයන් හා බෞද්ධ භික්ෂුන් වහන්සේලා මෙයට දායක වූහ. ස්වදේශිකයන් විචාරයකින් තොර ව බටහිර සංස්කෘතිය වැළඳගැනීම විවේචනය කිරීමෙන් දේශීය සංස්කෘතියේ ඇති උසස් ගුණාංග මහජනාතාවට අවබෝධකරදීමත් මෙහි අරමුණ විය

2. **බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමේ කටයු.තු**
   - අනගාරික ධර්මපාලතුමා ඉන්දියාවේ බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමට ක්‍රියා කිරීම
   - වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැකගැනීමට කැපවීම

3. **අමද්‍යප ව්‍යාපාරය**
   - බ්‍රිතාන්‍යයන්ගේ පාලන කාලය තුළ මත්පැන් පානය ලංකාවේ තදින් පැතිරයාම සමාජ ගැටලුවක් බවට පත්වෙමින් තිබුණි. මේ නිසා බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නයකයෝ ජනතාව මත්පැන් පානයෙන් මුදාගැනීමේ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම
   - අනාගාරික ධර්මපාල තුමා ''සිංහල බෞද්ධයා'' පුවත්පත මගින් හා ප්‍රසිද්ධ දේශන මගින් මේ සඳහා කැපවීම
   - පියදාස සිරිසේන මහතා තම නව කථාවලදී විවිධ චරිත සංවාදයට ලක්කොට මත්පැන් පානයෙන් ඇති වු විපාක පැහැදිලි කිරීම
   - ජෝන් ද සිල්වා මහතාගේ නාට්‍ය මගින් දැනුවත් කිරීම

**හින්දු ආගමික පුනරුදය**

- ක්‍රිස්තියානි මිෂනාරී කටයුතු ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ දිවයිනේ උතුරු ප්‍රදේශයන්හි පාසල් මගින් ලබාදුන් අධ්‍යාපනය නිසා සිය සංස්කෘතිය මෙන්ම පාරම්පරික සිරිත් විරිත් ද විනාශවනු ඇතැයි බියක් හින්දු භක්තිකයන් අතර ඇතිවීම
- එහි ප්‍රතිඵලයක් ලෙස හින්දු භක්තිකයන් අතර ආගමික ප්‍රබෝධයක් ඇතිවීම
- මෙම ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස ශ්‍රී ආරුමුග නාවලර්තුමා කටයුතු කිරීම

  ශ්‍රී ආරුමුග නාවලර්තුමාගෙන් ඉටුවු සේවයඃ

  - ද්‍රවිඩ, සංස්කෘත, ඉංග්‍රීසි යන භාෂා පිළිබඳ හසල දැනුම තම කාර්යයන් හා යොදා ගැනීම

- හින්දු දරුවන් සඳහා තම නිවසේ පන්ති පැවැත්වීම
- ශෛව පරිපාලන සභා හා හින්දු අධ්‍යාපන සභාව ඇරඹීම
- යාපනයේ හින්දු ඉංග්‍රීසි පාසල ආරම්භ කිරීම
- හින්දු දරුවන් සඳහා පොත්පත් රචනා කිරීම හා දෙමළ බසින් ලියවුණු ගද්‍ය, පද්‍ය ගීත ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරිම
- හින්දු ආගමේ ප්‍රබෝධයක් ඇතිකිරීම
- මෙතුමාගේ ව්‍යාපාරය පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම් වැනි නායකයින් තවදුරටත් ඉදිරියට ගෙනයාම
- **ශෛව පරිපාලන සභා** සහ **හින්දු අධ්‍යාපන සභා** නම් සංවිධාන දෙක හින්දු සංස්කෘතික ප්‍රබෝධයේ පෙරමුණ ගෙන ක්‍රියාකිරීම

**ඉස්ලාම් ආගමික පුනරුදය**

- ඉස්ලාම් ආගමික පුනරුදය ඇතිවීමට හේතු
- එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා පුරෝගාමී ව කටයුතු කිරීම

**එම්.සී. සිද්දි ලෙබ්බේ මහතාගෙන් ඉටු වූ සේවය**

- ආරාබි භාෂාව පමණක් නොව ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට ද ඉස්ලාම් ජනතාව උනන්දු කරවීම
- කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම
- කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම
- ඉස්ලාම් කාන්තා පාසල් ආරම්භ කිරීම
- "මුස්ලිම් නේෂන්" පුවත්පත ආරම්භ කිරීම
- මෙලෙස බටහිර ජාතීන්ගේ බලපෑමට එරෙහි ව දේශීය සම්ප්‍රදාය හා සංස්කෘතිය ආරක්ෂා කර ගැනීම සඳහා දේශීය නායකයින් කටයුතු කිරීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න**

01. ආගමික හා සංස්කෘතික පුනරුද ව්‍යාපාරයේ නායකයෝ (හික්කඩුවේ සුමංගල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා, පියදාස සිරිසේන මහතා, ආරුමුග නාවලර්තුමා සහ එම්. සී. සිද්ධි ලෙබ්බේ මහතා) යන මාතෘකාව යටතේ කුඩා හැකුළුම්පතක් නිර්මාණය කිරීම

    - කැමති නායකයන් තිදෙනෙකු පිළිබඳ ව තොරතුරු ලිවීමට උනන්දු කරවන්න
    - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
    - බෞද්ධ, හින්දු, මුස්ලිම් පුනරුද ව්‍යාපාරයේ නායකයන්ගේ කාර්යභාරයන් සිසුන්ට පැහැදිලි කරදෙන්න
    - මෙම නායකයන් පිළිබඳ තොරතුරු ලබාගත හැකි වෙනත් මූලාශ්‍රය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න

- හැකුළුම්පත වඩාත් නිර්මාණශීලි ව සකස් කිරීමට චිත්‍ර, ඡායාරූප යොදා ගැනීමට උපදෙස් දෙන්න
- තම අභ්‍යාස පොතේ අලවා භාවිතයට ගත හැකි ලෙස හැකුළුම්පත නිර්මාණය කරන ලෙස දන්වන්න
- සිසු ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවා ඇගයීම හා තක්සේරුකරණය කරන්න
- පසු වැඩ ලෙස ඇමුණුම 01 හි කෙටි සටහන් ලිවීමට සිසුන් යොමු කරන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

- පෙළපොත හා වෙනත් මූලාශ්‍රය
- A4 කොළ
- ප්ලැටිග්නම්, ගම්
- පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට උරදුන් නායකයින් නම් කරයි
- ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට උරදුන් නායකයින්ගේ සේවාව අගය කරයි
- ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට උරදුන් නායකයින් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු රැස් කරයි
- හැකුළුම්පතට උචිත ව තොරතුරු රැස් කරයි
- නිර්මාණශීලී ව හැකුළුම්පත සකසයි

**ඇමුණුම 01**

පහත කරුණු පිළිබඳ සිසු අභ්‍යාස පොතේ කෙටි සටහන් ලිවීමට උපදෙස් දෙන්න

1. 19වන සියවස තුළ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකාවේ මිෂනාරී ව්‍යාපාරය
2. පානදුරාවාදය
3. පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම
4. මහාබෝධි සමාගම
5. තරුණ බෞද්ධ සංගමය
6. ශෛව පරිපාලන සභා සහ හින්දු අධ්‍යාපන සභා
7. මුස්ලිම් අධ්‍යාපන සංගමය

## 11.4 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්

වර්ෂ 1815 දී උඩරට රාජධානිය යටත් කර ගැනීමෙන් පසු ව, ඉංග්‍රීසින් විසින් ක්‍රියාත්මක කරන ලද දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ නිසා දිවයිනේ සෑම ක්ෂේත්‍රයක ම ප්‍රබල වෙනස්කම් ඇති විය. ඔවුන් 1833 දී හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ස්වදේශිකයන්ට කිසිඳු වගකීමක් පැවරී නොතිබීම ගැන විසි වන සියවස ආරම්භයේ සිට ලාංකික උගතුන් විසින් උද්ඝෝෂණ කරන ලදී. මෙසේ මධ්‍යම පාන්තිකයින් ගෙන ගිය උද්ඝෝෂණ නිසා වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇති කිරීමට ඉංග්‍රීසීන්ට සිදු විය. එම ප්‍රතිසංස්කරණ මාලාවේ අවසන් ප්‍රතිසංස්කරණය වූයේ සෝල්බරි ආණ්ඩුක්‍රමයයි. එහි දී ලාංකික නායකයින් කළ බලපෑම් නිසා 1948 දී පාලන බලතල ස්වදේශිකයන්ට පවරා දීමට ඉංග්‍රීසින්ට සිදු විය. ශ්‍රී ලංකාවට නිදහස යලි දිනා ගැනීම තෙක් ගෙන ගිය දේශපාලන උද්ඝෝෂණ, වරින් වර ඇති වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා යලි නිදහස දිනා ගැනීමේ කටයුතු මෙම ඒකකයේ දී අවධානය යොමු කෙරේ.

**නිපුණතාව**

- ජාතික ව්‍යාපාරය ඇසුරින් ජාතික ඒකාබද්ධතාව සහ සාමය පවත්වාගෙන යාමේ වැදගත්කම මතු කර දක්වයි

**නිපුණතා මට්ටම්**

4.1 ආණ්ඩුක්‍රම විකාශනය හා ජාතික ව්‍යාපාරය විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව : 10 යි**

**ඉගෙනුම් පල**

- කොල්බෲක් සිට සෝල්බරි දක්වා බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම විකාශනය පැහැදිලි කරයි
- අමද්‍යප ව්‍යාපාරයේ හා ජාතික ව්‍යාපාරයේ නැගීම විස්තර කරයි
- ජාතික ව්‍යාපාරය ආරම්භක අවධියේ ජාතික නායකයන්ගේ එක්සත්භාවය අගයයි
- ජාතික එක්සත්භාවය රැක ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැලසුම් කර ගන්න

11.4 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස් වීම

**4.1 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණ**

- කොල්බෲක් කොමිසම පැමිණීම
- 1833 ආණ්ඩුක්‍රමය හා ව්‍යවස්ථාදායක, විධායකය සභා පිහිටුවීම
- යුරෝපීය ව්‍යාපාරිකයන්ගේ උද්ඝෝෂණ

**4.2 1910 ප්‍රතිසංස්කරණ හා පසුබිම**

- ලාංකික මධ්‍යම පන්තියේ ඉල්ලීම්
- 1910 ප්‍රතිසංස්කරණය
- අමද්‍යප ව්‍යාපාරය
- ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ආභාසය
  - ඉන්දියානු සටනේ ස්වරූපය
  - මහත්මා ගාන්ධි ඉන්දියානු ජාතික ව්‍යාපාරයට සම්බන්ධ වීම
  - ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ කැපී පෙනෙන චරිත
  - ලංකාවට ආභාසය ලැබීම
  - ලංකා ජාතික සංගමය පිහිටුවීම
  - 1920 හා 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

**4.3 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය**

- රාජ්‍ය මන්ත්‍රණ සභාව
- විධායක කාරක සභා ක්‍රමය
- සර්වජන ඡන්ද බලය
- ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන්

**4.4 නිදහස සඳහා උද්ඝෝෂණ**

- රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ උද්ඝෝෂණ
- වාමාංශික ව්‍යාපාරය හා උද්ඝෝෂණ (සූරියමල් ව්‍යාපාරය)
- අමාත්‍ය මණ්ඩලයේ ඉල්ලීම්
- ජාතික සංගමයේ කටයුතු
- සොල්බරි ආණ්ඩුක්‍රමය හා දේශපාලන බලය ලාංකිකයන්ට පැවරීම

**බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇසුරෙන් ඇමුණුම 01හි සඳහන් වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- මේ සඳහා කාලපරිච්ඡේද දෙකක් යොදා ගන්න
- බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 1හි වගුව හුණු පුවරුවේ සටහන් කර කණ්ඩායම්වලට එය පන්තියේ ප්‍රදර්ශනය කිරීමට හැකි වන ලෙස (බ්‍රිස්ටල් බෝඩ් හෝ ඒ හා සමාන කොලයක) පිටපත් කර ගැනීමට දන්වන්න
- පෙළ පොත ඇසුරින් කණ්ඩායමේ සියලු දෙනා සමග සාකච්ඡා කරමින් වගුව සම්පූර්ණ කිරීමට දැනුම් දෙන්න

- සෑම කණ්ඩායම් ක්‍රියාකාරකමක් ම අවසානයේ පන්තියේ ප්‍රදර්ශනය කර අදාළ තොරතුරු විස්තර කිරීමට උපදෙස් දෙන්න
- සිසු ඉදිරිපත් කිරීම්වල තොරතුරු හා ඌන පූර්ණ සපයමින් හුණු පුවරුවේ වගුව සම්පූර්ණ කරන්න
- හුණු පුවරුවේ වගුව ශිෂ්‍ය අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න
- පාඩම අවසානයේ පසු වැඩ ලෙස **''බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස් වීම''** පාඩම ආවරණය වන පරිදි කෙටිප්‍රශ්න හා පිළිතුරු පොතක් සකස් කිරීමට උපදෙස් දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිස්ටල් බෝඩ්, ෆෙල්ට් පෑන්
- ඇමුණුම 01 වගුව

| වර්ෂය | ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | විධායකට පත් කළ සාමාජික සංඛ්‍යාව | ව්‍යවස්ථාදායකයට පත් සාමාජික සංඛ්‍යාව | වැදගත් ප්‍රතිසංස්කරණ යෝජනා |
|---|---|---|---|---|
| | | | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න

- බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නම් කරයි
- දේශීය නායකයින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් පාලන බලතල ක්‍රමික ව ලබා ගත් ආකාරය පෙන්වා දෙයි
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු නිවැරදි ව වගු ගත කරයි
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට දායක වෙයි
- වගුව පන්තියට ඉදිරිපත් කරයි

## 11.5 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය

ක්‍රි.ව. 1796 දී ශ්‍රී ලංකාවට පැමිණි බ්‍රිතාන්‍යයෝ ක්‍රි. ව. 1815 වන විට මුලු දිවයිනම යටත් කරගනිමින් ක්‍රි.ව. 1948 නිදහස ලැබෙන තෙක් මෙරට පාලනය කළ බව මින් ඉහත පාඩම්වලින් විස්තර විය. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට සිදු වු ආර්ථික, සමාජ හා සංස්කෘතික වෙනස්කම් සහ බ්‍රිතාන්‍ය පාලනයෙන් උරුම වු ප්‍රයෝජනවත් අංග පිළිබඳ ව මෙහි දී අවධාරණය කර ඇත.

**නිපුණතාව**

- ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකූලනය වු ආකාරය විග්‍රහ කරයි

**නිපුණතා මට්ටම**

5.1 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකේය සමාජයට එක් වු නවාංග පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 05 යි**

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික වෙනස්වීම් පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය අන්තර්ගතය ආවරණය වනසේ පාඩම සැලසුම් කරගන්න

**11.5 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය**

**5.1 හැඳින්වීම**

- සාම්ප්‍රදායික ආර්ථික හා සමාජ රටාව බ්‍රිතාන්‍යයන් යටතේ බටහිර සාම්ප්‍රදාය අනුව පරිවර්තනය වු ආකාරය පැහැදිලි කිරීම

**5.2 ආර්ථික වෙනස්වීම්**

- කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ
  - ක්‍රි.ව. 1833 සිට ක්‍රියාත්මක වු කොල්බෲක් කොමිසමේ යෝජනාවලින් නව ආර්ථික රටාවකට පදනම වැටීම
  - යුරෝපීය ජාතීන්ට දිවයිනේ පදිංචිවීමට හා ඉඩම් අයිතිකර ගැනීමට තිබු සීමාවන් ඉවත් කිරීම
  - රජය නොමිලේ ඉඩම් ලබාදුන් ක්‍රමය අවලංගු කර ඒ වෙනුවට ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දීම
  - පෞද්ගලික ව්‍යවසායකයන්ට අවශ්‍ය ශ්‍රමය බාධාවකින් තොරව ලබාගැනීමට ඉඩ සැලසීම සඳහා අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
  - රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම

**වතු වගාවේ දියුණුව**

- ශ්‍රී ලංකාවේ වතු වගාවේ ආරම්භය
- වතු වගාවක් ලෙස මුලින් ම කෝපි වගා කිරීම
- හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් නැමැති දිලීර රෝගය වැළඳීම නිසා කෝපි වගාව පරිහානියට පත් වීම
- සිංකෝනා නව වගාවක් ලෙස හඳුන්වා දීම හා එය ද අසාර්ථක වීම
- වැවිලි කරුවන්ගේ අවධානය තේ වගාව කෙරෙහි යොමු වීම
- තේ වගාව සාර්ථක වීම
- පොල් වගාව සඳහා ස්වදේශිකයින් ඉදිරිපත් වීම
- ක්‍රි.ව. 1890 වන විට ශ්‍රී ලංකාවේ රබර් වගාව වාණිජ භෝගයක් ලෙස ව්‍යාප්ත කිරීම
- වතු වගාව නිසා මහනුවර, බදුල්ල, ඇතුලු දිවයිනේ සෙසු ප්‍රදේශ සම්බන්ධ කරමින් මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම
- පණිවුඩ හුවමාරු කටයුතු (සන්නිවේදන කේෂ්ත්‍රයේ) දියුණුවක් ඇතිවීම
  උදා. තැපැල් සේවය ආරම්භ වීම
- වතු වගාවේ දියුණුවක් සමග මෙරට ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටීම සහ ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම
- ක්‍රමයෙන් මෙරට ආනයන-අපනයන ආර්ථික රටාවකට යොමු වීම
- ද්විත්ව ආර්ථික ක්‍රමයක් ඇතිවීම

**ඉහත විෂය කරුණු ආවරණය වනසේ ''ශ්‍රී ලංකාව ආනයන අපනයන ආර්ථික රටාවකට යොමු වූ අයුරු'' යනුවෙන් පුවත්පතකට සුදුසු ලිපියක් සැකසීමට සිසුන් යොමු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඉහත සඳහන් මාතෘකාව යටතේ ලිපිය රචනා කිරීමේ දී ශ්‍රී ලංකාවේ පැවති සාම්ප්‍රදායික ආර්ථික රටාව, බ්‍රිතාන්‍යයන් යටතේ වාණිජ වගාවන් සඳහා යොමුවීම, හඳුන්වාදුන් නව භෝග හා ක්‍රමයෙන් දේශීය ආර්ථික රටාව ආනයන, අපනයන ආර්ථිකයට පරිවර්තනය වීම යන කරුණු ඇතුලත් වනසේ සැකසීමට උපදෙස් දෙන්න
- මෙම ක්‍රියාකාරකම සඳහා එක් කාලච්ඡේදයක් ලබාදෙන්න
- පෙළ පොත භාවිත කරමින් ලිපිය රචනා කිරීමට උපදෙස් දෙන්න
- සිසු ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න
- ඇමුණුම 01 හි ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීම පසු වැඩ ලෙස දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

| |
|---|
| **බ්‍රිතාන්‍යයන් යටතේ වූ වතු වගාව ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**<br>i. කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා තුනක් ලියන්න<br>ii. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ව්‍යාප්ත කළ වැවිලි භෝග හතරක් නම් කරන්න<br>iii. වතු වගාව සඳහා මෙරට ඉඩම් ලබාගත් ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න<br>iv. වතු වගාව නිසා මෙරට ආර්ථිකයට සිදු වූ වාසි හා අවාසි දෙක බැගින් විස්තර කරන්න |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත නිර්ණායක අනුව තක්සේරුව හා ඇගයීම සිදුකරන්න

- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ වතු වගාව ආරම්භ වූ අයුරු විස්තර කරයි
- සාම්ප්‍රදායක කෘෂිකර්මාන්තය යටපත් ව වතු වගාව දියුණු වූ අයුරු පෙන්වාදෙයි
- වතු වගාව නිසා මෙරට ඇති වූ සංවර්ධනය අගය කරයි
- පුවත්පතකට උචිත ලෙස ලිපිය නිර්මාණශීලී ව රචනා කරයි
- නියමිත කාලයට නිම කරයි

**නිපුණතාව**

- ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකූලනය වූ ආකාරය විග්‍රහ කරයි

**නිපුණතා මට්ටම**

5.1 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකේය සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 02 යි**

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ සහ සංස්කෘතික වෙනස්වීම් පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය අන්තර්ගතය ආවරණය වනසේ පාඩම සැලසුම් කරගන්න

**5.3 සමාජ වෙනස්වීම්**

**සමාජ**

- පැරණි ප්‍රභූ පන්තිය අභාවයට යාම හා නව මධ්‍යම පන්තියක් බිහි වීම
- ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා යුරෝපීය සංස්කෘතිය ගරු කරන බටහිර ගැති ස්වදේශිකයින් පිරිසක් බිහි වීම
- දේශීය ප්‍රභූ පන්තියට අයත් පිරිස් බදු රේන්ද මිලදී ගැනීමෙන් හා වතු වගාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමෙන් ද, වතු හිමියන් බවට පත්වීමෙන් ද තම ධනය වර්ධනය කර ගැනීම
- බටහිර ක්‍රමයට හැඩ ගැසුනු ධනවත් නාගරික පිරිසක් බිහි වීම
- නව රැකියා අවස්ථා ඇති වීම
- වතු සේවය ආශ්‍රයෙන් (භාණ්ඩ බෑම හා පැටවීම, කරත්ත දැක්කීම, රෙදි සේදීම) නාගරික කම්කරු පන්තියක් හා ඉන්දියාවෙන් වතුවල සේවයට ආ පිරිසෙන් වතු කම්කරු පන්තියක් බිහි වීම හා මෙම කම්කරුවන්ගෙන් වෘත්තීය සංගම් පිහිටුවා ගැනීම

**සංස්කෘතික වෙනස්වීම්**

- ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා ඉංග්‍රීසි භාෂාව උගත් පිරිසක් සමාජයට එකතු වීම
- බටහිර සංස්කෘතිය, සිරිත් විරිත් ගරු කරන පිරිසක් බිහි වීම
- බටහිර විලාසිතා, ආහාර, ඇඳුම්, ගෘහ නිර්මාණ මෙරට සංස්කෘතියට එකතු වීම

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සංස්කෘතික වෙනස්වීම පිළිබඳ ලියවුණු පොත්පත්, චිත්‍රපට ආදිය
  උදා.: ගම්පෙරලිය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පාඩමේ අරමුණු හා ඉගෙනුම් පල මැනෙන සේ ඇගයීම් හා තක්සේරු උපකරණ සකස්කර ගන්න

**නිපුණතාව**

- ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකූලනය වූ ආකාරය විග්‍රහ කරයි

**නිපුණතා මට්ටම**

5.1 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකීක සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි**

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලාංකීක සමාජයට එක් වූ යහපත් හා අයහපත් ලක්ෂණ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ආවරණය වනසේ පාඩම සැලසුම් කරගන්න

**5.4 බ්‍රිතානය පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංග**

- ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමට අවස්ථා විවරවීම
- ප්‍රවාහන කටයුතු හා පණිවුඩ හුවමාරුව දියුණුවීම.
- බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මික විප්ලවයේ බලපෑම ශ්‍රී ලංකාවට ද ලැබීම
  උදා.: යන්ත්‍ර සූත්‍ර, ඒවාට අදාළ තාක්ෂණය, මාර්ග...............ආදී
- සුළු පරිමාණ කර්මාන්ත ආරම්භවීම
- අපනයන වැවිලි භෝග හඳුන්වා දීම

**5.5 අහිතකර බලපෑම්**

- දේශීය සංස්කෘතිය පිරිහීම
- මත්පැන් පානය ව්‍යාප්ත වීම
- ස්වයංපෝෂිත ආර්ථිකය හා දේශීය දැනුම බිඳ වැටීම
- ගම් සභාව වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම
- ඉඩම් අහිමි ජනතාවක් සමාජගත වීම

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ "බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකීක සමාජයට යහපතක් විය / අයහපතක් විය" යන මාතෘකාව යටතේ විවාදයක් පැවැත්වීම**

- විවාදය පැවැත්වීමට සුදුසු ලෙස පන්තිය කණ්ඩායම් කරන්න
- කණ්ඩායම් දෙකක් සකස් කර විවාද මාතෘකා ලබාදෙන්න
- විවාදය පැවැත්වීමට දිනයක් යොදා කණ්ඩායම් දෙකට අදාළ මාතෘකා සඳහා සූදානමින් පැමිණීමට දැනුම් දෙන්න
- විවාදය සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදාගන්න
- අදාළ නීති රීති අනුව විවාදය පවත්වන්න

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට සමාජ පරිවර්තනය පිළිබඳ ලියවුණු පොත්පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදුකරන්න

- බ්‍රිතාන්‍ය පාලනයෙන් මෙරට සමාජයට එක් වූ යහපත් හා අයහපත් ලක්ෂණ විස්තර කරයි
- යහපත් ලක්ෂණ අගය කරයි
- තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරයි
- විවාදය සඳහා ඉදිරිපත් වෙයි
- විවාදයට අදාළ කොන්දේසි පිළිපදියි

## 11.6 ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

සියවස් එකහමාරකට අධික කාලයක් පැවති බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයෙන් ශ්‍රී ලංකාවට නිදහස හිමි වූයේ 1948.02.04 වන දා ය. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩු බලය පිහිටුවා ගැනීම පිළිබඳ ව මෙන් ම 1972 හා 1978 ජනරජ ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂා කෙරේ. එමෙන් ම, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා ගත් ක්‍රියාමාර්ග මෙන් ම අධ්‍යාපනය, කෘෂිකර්මය, රාජ්‍ය ව්‍යවසාය, කර්මාන්ත හා සමාජ සුභසාධනය සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ව ද විමසා බැලීම මෙම ඒකකය මගින් අපේක්ෂිත ය.

**නිපුණතාව**

- නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය විමසා බලයි

**නිපුණතා මට්ටම**

6.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:**

**06 යි**

**ඉගෙනුම් ඵල**

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩු බලය පිහිටුවා ගැනීම පිළිබඳ ව විස්තර කරයි
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධන පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.

**6.1 සොල්බරි ආණ්ඩුක්‍රමය හා ශ්‍රී ලංකාවට නිදහස ලැබීම**

- සෝල්බරි ප්‍රතිසංස්කරණය යටතේ ක්‍රි.ව. 1947 දී ප්‍රථම වතාවට දේශපාලන පක්ෂ ක්‍රමය යටතේ, මහ මැතිවරණයක් පැවැත්වීම පිළිබඳ සිසුන්ට පැහැදිලි කර දෙන්න
  - එම මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කිරීම.
  - එම පක්ෂයේ නායක ඩී.එස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් යුතු රජයක් පිහිටු වීම
- ලාංකිකයන්ගේ උද්සෝෂණවල ප්‍රතිපලයක් ලෙස 1948.02.04 වන දින ශ්‍රී ලංකාවට නිදහස හිමි වීම
- සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- පසු ව දේශපාලන පක්ෂ පදනම් කර ගෙන මැතිවරණ පැවැත් වීම ලංකා දේශපාලනයේ සුවිශේෂී ලක්ෂණයක් වීම

- ශ්‍රී ලංකාවේ පිහිට වූ දේශපාලන පක්ෂ කිහිපයක් නම් කිරීම
    - 1935 ලංකා සමසමාජ පක්ෂය
    - 1946 එක්සත් ජාතික පක්ෂය
    - 1951 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

**6.2 1956 මැතිවරණය හා සමාජ පෙරළිය**

- නිදහසින් පසු ලංකාවේ මැතිවරණවලින් 1956 පැවැත් වූ මැතිවරණය සුවිශේෂී වීම

**6.3 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීම**

- ශ්‍රී ලංකාව ජනරජයක් වීමේ වැදගත්කම පැහැදිලි කිරීම
- 1947 පිහිට වූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකොට 1972 මැයි 22 දින සිට ශ්‍රී ලංකාව ප්‍රථම වරට නිදහස් ස්වෛරී ස්වාධීන ජන රජයක් බවට පත් වීම. එය 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව මගින් සිදු වීම
- 1972 ජනරජ ව්‍යාවස්ථාව මගින් ව්‍යවස්ථාදායකය විධායකය හා අධිකරණය ක්‍රියාත්මක වූ ආකාරය
    - මූලික අයිතිවාසිකම්
    - ජනාධිපතිවරයා
        * නාමමාත්‍රික විධායකයෙක් වීම.
        * අගමැති විසින් නම් කිරීමෙන් පත් කිරීම.
        * ජනාධිපතිවරයා සතු බලතල හා කාර්යයන් කිහිපයක් දැක්වීම
    - මන්ත්‍රී මණ්ඩලය
        * ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර ආයතනය වීම
    - අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය
    - අධිකරණ පද්ධතිය

**6.4 1978 නව ආණ්ඩුක්‍රමය**

- පූර්ණ විධායක බලතල සහිත ජනාධිපතිවරයෙකු ඇතුලු ආණ්ඩුක්‍රමයක් වීම
- ජනාධිපතිවරයා
    * පත්වන ආකාරය
    * බලතල හා කාර්යයන්
    * ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද ආණ්ඩුවේ ප්‍රධානියා ද සන්නද්ධ සේවාවන්හි ප්‍රධානියා ද වීම
- අගමැති හා අමාත්‍ය මණ්ඩලය
- පාර්ලිමේන්තුව
    * පාර්ලිමේන්තුවේ සංයුතිය
    * බලතල හා කාර්යයන්

- අධිකරණය
- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ දක්වා ඇති විධි විධාන
- ජනාධිපතිවරණය
- සමානුපාතික නියෝජන ක්‍රමය
- ජනමත විචාරණය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ 19721978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්වල වෙනස්කම් පැහැදිලි වන වගුවක් සම්පූර්ණ කිරීම**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 1හි සඳහන් වගුව අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න
- එහි සඳහන් ක්ෂේත්‍ර යටතේ තොරතුරු සම්පූර්ණ කිරීමට යොමු කරවන්න
- අනෙක් සිසුන් සමග සාකච්ඡාකොට තොරතුරු ලබා ගැනීමට ද අවස්ථාව දෙන්න
- සිසු ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කරන්න
- මේ සඳහා එක් කාල පරිච්ඡේදයක් ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 01

| | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
|---|---|---|
| 1. ව්‍යාවස්ථාදායකය | | |
| 2. විධායකය | | |
| 3. අධිකරණය | | |
| 4. මූලික මිනිස් අයිතිවාසිකම් | | |

**ඇගයීම හා තක්සේරුකරණය**

1. ජනරජ ව්‍යවස්ථා මගින් ඇති කළ නව අංග නම් කරයි
2. 1972 ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාව නිදහස් ජනරජයක් වීම පිළිබඳ අභිමානයෙන් කතා කරයි
3. ජනරජ ව්‍යවස්ථාවල අංග ලක්ෂණ සන්සන්දනාත්මක ව වගු ගත කරයි
4. තමා සොයා ගත් තොරතුරු අන්‍යයන්ට ප්‍රකාශ කරයි
5. නියමිත කාලයට කාර්යය නිම කරයි

**නිපුණතා මට්ටම්**

6.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධනය උපාය මාර්ග හා එහි ඵලදායීතා ව විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව :**

**10 යි**

**ඉගෙනුම් පල**

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාමාර්ග පැහැදිලි කරයි
- සංවර්ධන ක්‍රියාමාර්ගවල ඵලදායීතාව පෙන්වා දෙයි
- සමාජ සුබසාධනය යනු කුමක්දැයි පැහැදිලි කරයි
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සුභසාධන වැඩසටහන් විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම් සැලසුම ගොඩනගන්න

**6.2 නිදසෙන් පසු සංවර්ධන කටයුතු**

- කෘෂි කර්මාන්තය දියුණු කිරීම
- ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ කිරීම
- වැව් අමුණු ප්‍රතිසංස්කරණය හා වාරිමාර්ග තැනවීම
- ඉඩම් ප්‍රතිසංස්කරණය
- මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය හා වෙනත් ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාර
- කෘෂිකර්ම පර්යේෂණායතනය ආරම්භ කිරීම
- ගොවි ජනතාවගේ තත්ත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම
- ව්‍යාපාරික කෘෂිකර්මාන්තය
- සුළු අපනයන භෝග දියුණු කිරීම
- කාර්මීකරණ ප්‍රතිපත්තිය
  - රාජ්‍ය මැදිහත් වීමෙන් විවිධ කර්මාන්තශාලා ආරම්භ කිරීම.
    - වානේ කම්හල
    - කොහුවල, පේසාල, තුල්හිරිය පේශ කම්හල
    - ගිංතොට/ කොස්ගම තුනී ලෑලි සංස්ථාව
    - හිඟුරාන සීනි කම්හල
    - පුල්මුඩේ ඛනිජ වැලි

  - ආනයන ආදේශන ප්‍රතිපත්තිය
    - විදේශීවලින් ලංකාවට ගෙන එන කෘෂිකාර්මික හා කාර්මික භාණ්ඩවලට විශාල විදේශ විනිමයක් වැය වන බැවින් ජාතික ධනය ඉතිරි කර ගැනීම පිණිස රට තුළ ම ඒ දේවල් නිෂ්පාදනය කිරීමේ වැඩපිළිවෙලක් දියත් කිරීම. වර්ෂ 1970 - 1977 කාලයේ දී ආනයන ආදේශන ප්‍රතිපත්තිය වැඩි වැඩියෙන් ක්‍රියාත්මක විය

  - අධ්‍යාපනය
    - නිදහස් අධ්‍යාපනය අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම
    - දිවා ආහාර වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම
    - පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම
      * සෑම පාසලකට ම විද්‍යාගාරයක් ලබා දීම

- උසස් අධ්‍යාපනය
  * විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල තත්වයට පත් කිරීම
  * ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියට ගෙන යාම හා එය වැඩිදියුණු කිරීම
  * විවිධ විශ්වවිද්‍යාල පිහිටුවීම

**6.3 සමාජ සුබසාධනය**

රාජ්‍යයක් එහි පුරවැසියන්ගේ සුබසාධනය උදෙසා වගකිව යුතු ය යන මූලධර්මය පදනම් කර ගනිමින් එම පුරවැසියන්ගේ ආර්ථික හා සමාජ සුභසාධනය හා ආරක්ෂාව වෙනුවෙන් රජය මැදිහත් වෙමින් කැප වී ක්‍රියා කිරීම

- මෙහි අරමුණු කිහිපයක් පහත පරිදි හඳුනා ගත හැකිය
  - සමාන අවස්ථාවන් හිමි කර දීම
  - සමාන සම්පත් බෙදා දීම
  - සමාජයේ දුබල කොටස්වලට ඉදිරියට ඒමට ණය පහසුකම් හා සහනාධාර ඔස්සේ කිසියම් අවකාශයක් ලබා දීම
  - පුරවැසියන්හට යහපත් දිවිනැග්මක් ගත කිරීමට ඉඩ ප්‍රස්ථා හිමි කර දීම
  - නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රජයන් විසින් සමාජ සුබසාධනය සඳහා දියත් කළ වැඩසටහන් කිහිපයක්
    - සෞඛ්‍යය අංශය
      * රෝග නිවාරණය වසංගත රෝග මර්දනය, මැලේරියාව හා කොළරාව මර්දනය වැනි සෘජු රාජ්‍ය මැදිහත් වීම් අවශ්‍ය අවස්ථාවල අවධානය යොමු කිරීම.
      * සෞඛ්‍යය යටිතල පහසුකම් හා සේවා සැපයීම පුළුල් කිරීම
  - වෙනත් සුභසාධන කටයුතු
    - ප්‍රවාහනය ක්ෂේත්‍රය
      * ප්‍රවාහනය ජන සතු කිරීම
    - දිළිඳු සහන ක්‍රමය
      * හාල් පොත්
      * ආහාර සලාක ක්‍රමය
      * නිවාස යෝජනා ක්‍රමය

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධය සඳහා ගත් උපායමාර්ග හා සමාජ සුබසාධනය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග පැහැදිලිවන පරිදි ඇමුණුම 01 හි සඳහන් ක්‍රියාකාරකම සිදු කරවන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුමෙහි සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට දින කිහිපයක කාලයක් ලබා දෙන්න
- එම පිළිතුර ඇගයීමට ලක් කරන්න
- තවත් කාලච්ඡේදයක් හෝ දෙකක් යොදා ගෙන එම ප්‍රශ්නෝත්තර සිසුන් සමග සාකච්ඡා කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත හා වෙනත් මූලාශ්‍ර පරිශීලනය, නිවැරදි පිළිතුරු සැපයීම, උනන්දුවෙන් කාර්යයන් නිම කිරීම, පැහැදිලි හා පිරිසිදු බව ආදී අංග රැකෙන සේ නිර්ණායක සකස් කර ලකුණු පවරන්න

**ඇමුණුම 01**

පහත සඳහන් ප්‍රශ්නවලට පෙළපොත සහ වෙනත් මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් පිළිතුරු සපයන්න

01. i. ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ගොවිජනපද ව්‍යාපාර තුනක් නම් කරන්න
    ii. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති කෘෂි පර්යේෂණායතන කිහිපයක් නම් කරන්න
    iii. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ වැදගත්කම පැහැදිලි කරන්න
    iv. නිදහසින් පසු රජයේ මැදිහත් වීමෙන් ලංකාවේ ක්‍රියාත්මක කළ කාර්මීකරණ ප්‍රතිපත්තිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න

02. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව පහත කරුණු යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න
    - දිවා ආහාර වැඩ පිළිවෙල
    - පහසුකම් වැඩි දියුණු කිරීම
    - විශ්ව විද්‍යාල ආරම්භ කිරීම

03. i. සුභසාධනය සඳහා රාජ්‍යයක මැදිහත්වීම පැහැදිලි කරන්න
    ii. නිදහසින් පසු රජයක් විසින් ජනතාවගේ සුබසාධනය සඳහා ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පෙළපොත හා වෙනත් මූලාශ්‍රය පරිශීලනය, නිවැරදි පිළිතුරු සැපයීම, උනන්දුවෙන් කාර්යයන් නිම කිරීම, පැහැදිලි හා පිරිසිදු බව ආදී අංග රැකෙන සේ නිර්ණායක සකස් කර ලකුණු පවරන්න

## 11.7 ලෝකයේ කැපී පෙනෙන විප්ලව හා ජාතික ව්‍යාපාර

නූතන යුගයේ ඉතිහාසය හැදෑරීමේ දී මානව සංහතියේ ප්‍රගමනයට බෙහෙවින් ඉවහල් වූ විශිෂ්ට ප්‍රයත්න කිහිපයක් දක්නට ලැබේ. මේ අතර වැදගත්වන අමෙරිකානු නිදහස් සටන, ප්‍රංශ විප්ලවය, රුසියන් විප්ලවය පිළිබඳ මෙම පරිච්ඡේදයෙන් අවධානය යොමු කර ඇත.

**නිපුණතාව**

- ඓතිහාසික ගෝලීය හා කලාපීය දේශපාලන ප්‍රවණතාවල ආදර්ශ ආදේශනය කර ගනියි

**නිපුණතා මට්ටම්**

7.1 සාමූහික ව ක්‍රියා කිරීමෙන් තම අයිතීන් දිනා ගත හැකි බව අමෙරිකන් විප්ලවය ඇසුරින් පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව**

**02 යි**

**ඉගෙනුම් ඵල**

- අමෙරිකානු නිදහස් සටන පැහැදිලි කරයි
- අමෙරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ පාඩම සැලසුම් කර ගන්න

7.1 **අමෙරිකානු නිදහස් සටන**

**හැඳින්වීම**

- යුරෝපා ජාතීන් අමෙරිකාව සොයා ගැනීම හා එහි ජනපද පිහිටුවීම
- පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ප්‍රංශය හා බ්‍රිතාන්‍ය අමෙරිකාවේ ජනපද පිහිටුවා ගත් යුරෝපා රටවල් වීම
- බ්‍රිතාන්‍යයන් 18 වන සියවසේ දී අමෙරිකාවේ ජනපද 13ක් පිහිටුවීම
  ඒවා නම්,
  නිව්හැම්ෂයර්, මැසචුසෙට්ස්, රෝඩ් අයිලන්ඩ්, කනේටිකට්, නිව්යෝර්ක්, නිව්ජර්සි, පෙනිසිල්වේනියා, ඩෙලවෙයාර්, මේරිලන්ඩ්, වර්ජිනියා, උතුරු කැරොලිනා, දකුණු කැරොලිනා හා ජෝර්ජියාව යන ඒවා වේ
- බ්‍රිතාන්‍ය කිරීටය හා පාර්ලිමේන්තුව මගින් ජනපද පාලනය කිරීම
- බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස්වීමට ජනපදවාසීන් ගෙන ගිය අරගලය හා අමෙරිකානු නිදහස් සටන ලෙස හැඳින්වීම

**නිදහස් සටනට බල පෑ හේතු**

- බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් නව බදු වර්ග හඳුන්වා දීම
    - * මුද්දර බද්ද
    - * තේ, වීදුරු හා කඩදාසි සඳහා බදු අය කිරීම
    - * **'නියෝජිතයන් නොමැති නම් බදුත් නැත'** යන ජනපද වාසීන්ගේ විශ්වාසය
  - මෙම සියලු බදු වෙත ජනතා විරෝධය

- බ්‍රිතාන්‍ය ජාතිකයෝ ජනපදවලින් ලාභ ඉපැයීම පමණක් අපේක්ෂා කිරීම
- බොස්ටන් තේ සාදය
- ජෝර්ජ් වොෂිංටන් සටනේ නායකත්වය ගැනීම
- අමරිකානු නිදහස් ප්‍රකාශනය
- නිදහස් සටන ජය ගැනීම

**ප්‍රතිඵල**

- අමෙරිකානු එක්සත් ජනපදය නිදහස් රාජ්‍යයක් බවට පත් වීම
- අමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය
- ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- සමස්ත මානව සංහතියට නිදහසේ අගය පෙන්වා දීම හා එය ප්‍රංශ විප්ලවයට ආදර්ශයක් වීම

ඉහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ,

- ''අමෙරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන අයුරු'' මාතෘකාවට අදාළ රචනාවක් ලිවීම
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- රචනාව සඳහා සතියක කාලයක් ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- අමෙරිකානු විප්ලවය පිළිබඳ රචිත පොත් පත්

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත නිර්ණායක ඔස්සේ ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- අමෙරිකානු නිදහස් සටනේ ස්වරූපය පැහැදිලි කරයි
- අමෙරිකානු නිදහස් සටනින් ලෝකයට උරුම වූ දායාද අගය කරයි
- අමෙරිකානු නිදහස් සටන පිළිබඳ රචනාවක් ලියයි
- නිර්මාණශීලී ව කරුණු ඉදිරිපත් කරයි
- නියමිත කාලයට භාර දෙයි

**නිපුණතා මට්ටම**

7.2 මූලික මිනිස් අයිතීන් ආරක්ෂා කර ගැනීමට ප්‍රංශවාසීන් ගෙන ගිය අරගලය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව**

**03 යි**

**ඉගෙනුම් පල**
- ප්‍රංශ විප්ලවය පැහැදිලි කරයි
- විප්ලවයෙන් දිනා ගත් මූලික මිනිස් අයිතිවාසකම් පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි පාඩම සැලසුම් කර ගන්න

7.2 ප්‍රංශ විප්ලවය

**හැඳින්වීම**

- හිතුවක්කාර, දූෂිත පාලනයක් ගෙන ගිය 16 වන ලුවී රජුට එරෙහි ව එහි ජනතාව තම මානව අයිතීන් දිනා ගැනීම සඳහා ගෙන ගිය අරගලය මේ නමින් හැඳින්වීම
- මිනිස් අයිතිවාසිකම් දිනා ගැනීමේ වැදගත් අවස්ථාවක් ලෙස ප්‍රංශ විප්ලවය හැඳින්වීම
- නිදහස, සාමානාත්මතාවය, සහෝදරත්වය යන සංකල්ප පදනම් කර ගනිමින් විප්ලවය ක්‍රියාත්මක වීම

ප්‍රංශ විප්ලවයට බල පෑ හේතු

- **දේශපාලන හේතු**
    - රාජ්‍යත්වය දේව වරමක් ලෙස රජවරු සැලකීම
    - රජුට තිබූ අසීමිත බලය
    - සතුරන් මැඩලීමට රාජ්‍ය බලය යොදා ගැනීම
    - රජුගේ අති සුඛෝපභෝගී ජීවිතය
    - දූෂිත රාජාණ්ඩුව

  **සමාජ හේතු**
    - වැඩවසම් සමාජය
    - පන්ති සහිත සමාජයක් පැවතීම සහ එම පන්ති අතර තිබූ දුරස්ථභාවය
    - මධ්‍යම පාන්තිකයන්ට සමාජයේ තැනක් හිමි නොවීම

- **ආර්ථික හේතු**
    - ප්‍රංශ භාණ්ඩාගාරය බංකොලොත් වීම
    - සාමාන්‍ය ජනතාව වෙත පැවරී තිබූ අධික බදු බර
    - ප්‍රංශ මධ්‍යම පන්තියෙන් බදු අය කර ගැනීමට රජුට නොහැකි වීම

- **වෙනත් හේතු**
    - දාර්ශනික මත වාද
      රූසෝ, වෝල්ටෙයාර් හා මොන්ටෙස්කියු යන දාර්ශනිකයන්
    - අමෙරිකානු නිදහස් සටනේ බලපෑම

- **විප්ලවය ආරම්භ වීම**
    - ස්ටේට් ජනරාල් සභාව කැඳවීම
    - බැස්ටීලයට පහර දීම
    - මහජනතාව නැගී සිටීම
    - විප්ලවවාදීන්ගේ කටයුතු

- **විප්ලවයේ ප්‍රතිඵල**
    - 1791 මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය
    - ප්‍රංශ රාජාණ්ඩුව බිඳ වැටීම
    - ගොවි කම්කරු ජනතාව ලැබූ ජයග්‍රහණ
    - අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහි වීම
    - නැපෝලියන් බලයට පැමිණීම

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ 'ප්‍රංශ වාසීන් දිනාගත් මානව අයිතිවාසිකම්' නමින් රචනාවක් ලිවීමට සිසුන් යොමු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් සේ යොදාගන්න
- රචනාව ලිවීම සඳහා දින 02 ක පමණ කාලයක් ලබා දෙන්න
- සෑම රචනාවක් ම ඇගයීමට ලක්කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රංශ විප්ලවය පිළිබඳ වූ පොත්පත්

**ඇගයීම හා තක්සේරුකරණය**

- ප්‍රංශ විප්ලවය පිළිබඳ විස්තර කරයි
- ප්‍රංශ වාසීන් දිනා දුන් අයිතිවාසිකම් අගය කරයි
- රචනාව නිර්මාණශීලී ව ලියයි
- කරුණු ප්‍රමාණාත්මක ව ඉදිරිපත් කරයි
- නියමිත කාලයට භාර දෙයි

**නිපුණතා මට්ටම්**

7.3 සමාජ විෂමතා දුරු කර ගැනීම උදෙසා රුසියානු විප්ලවය ගෙන ගිය ආකාරය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව**

**03 යි**

**ඉගෙනුම් ඵල**

- රුසියානු විප්ලවය පැහැදිලි කරයි
- විප්ලවයෙන් දිනා ගත් සමාජවාදී සංකල්ප පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ආවරණය වන සේ පාඩම සැලසුම් කර ගන්න

7.3 **රුසියානු විප්ලවය**

**හැඳින්වීම**

- විසිවන සියවස වන විට රුසියාවේ පැවැති දූෂිත ඒකාධිපති රාජාණ්ඩුව හා වැඩවසම් සමාජ ක්‍රමයට එරෙහි ගොවි කම්කරු ඇතුළු රුසියානු සාමාන්‍ය ජනතාව විසින් රජයට එරෙහි ව ගෙන ගිය විප්ලවය මේ නමින් හැඳින් වීම
- **"සාමය, ඉඩම්, ආහාර"** විප්ලවයේ තේමාවන් වීම
- **"පන්ති රහිත සමාජයක්"** විප්ලවයේ අවසාන අරමුණ වීම
- 1917 මාර්තු හා ඔක්තෝබර් මස ඇති වූ විප්ලව දෙක මගින් විප්ලවවාදීන් ජය ගැනීම

රුසියානු විප්ලවයට බල පෑ හේතු

- රුසියාවේ දූෂිත ඒකාධිපති රාජාණ්ඩුව
- දූෂිත වැඩවසම් සමාජ ක්‍රමය
- සාමාන්‍ය ජනතාවට තිබූ අධික බදු බර
- රුසියන් - ජපන් යුද්ධයෙන් රුසියාව පැරදීම නිසා රජයට එරෙහි විරෝධතා පැන නැගීම
- විප්ලවය සඳහා ලෙනින්ගේ නායකත්වය ලැබීම
- කැරලිකරුවන් මැඩලීම සඳහා රජයේ දැඩි මර්දනකාරී පිළිවෙත හා ඊට මුහුණ දෙමින් කැරලි කරුවන් සංවිධානය වීම
- පළමු ලෝක යුද්ධ සමයේ ගොවීන්, සොල්දාදුවන් ලෙස බඳවා ගැනීමෙන් උද්ගත වූ අර්බුද
- 1917 වන විට ''සාමය, ඉඩම්, ආහාර'' තේමාව කර ගනිමින් රට පුරා ඇති වූ කැරලි සහ වැඩවර්ජන
- සොල්දාදුවන් ද කැරලිකරුවන් හා එක් වීම
- කෙරෙන්ස්කිගේ නායකත්වයෙන් වූ තාවකාලික ආණ්ඩුව හා එහි අසාර්ථකත්වය

- ලෙනින්ගේ නායකත්වයෙන් වැඩවසම් සමාජ ක්‍රමය, ධනවාදී ආර්ථික ක්‍රමය විනාශ කර පන්ති රහිත සමාජයක් ගොඩනැගීම අරමුණු කර ගනිමින් නැවත රට පුරා සංවිධානය වීම
- ජනතා සභාය මත ලෙනින් ජය ගැනීම

**රුසියානු විප්ලවයේ ප්‍රතිඵල**

- රටට සාමය උදා වීම
- පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කර සමූහ ගොවිපල ක්‍රමය ආරම්භ කිරීම
- ජනසතු කිරීමේ ව්‍යාපාරය
- රාජාණ්ඩුව වෙනුවට සමාජවාදී පදනමකින් යුතු සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය පිහිටුවීම
- සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම
- කොමියුනිස්ට් පක්ෂය බිහි වීම
- නිර්ධන පන්ති විප්ලව ලොව පුරා ව්‍යාප්ත වීම

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ''සමාජවාදී දර්ශනයේ යහපත් ලක්ෂණ'' යන මැයෙන් රචනාවක් ලිවීමට සිසුන් යොමු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- සියලු ම ක්‍රියාකාරකම් ඇගයීමට ලක්කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- රුසියානු විප්ලවය පිළිබඳ ඇති පොත්පත්

**ඇගයීම හා තක්සේරුකරණය**

- සමාජවාදී දර්ශනය පැහැදිලි කරයි
- සාමාජවාදී දර්ශනයේ යහපත් ලක්ෂණ අගය කරයි
- රචනාවක් ලිවීමේ දී අනුගමනය කළ යුතු කරුණු නිවැරදි ව පිළිපදියි
- පැහැදිලි ව කරුණු ගොනු කරයි
- නියමිත කාලයට නිම කරයි

## 11.8 ලෝක මහා සංග්‍රාමය හා සම්මුතීන්

විසිවන සියවසේ මුල් භාගයේ දී සමස්ත ලෝකය ම මහා සංග්‍රාම දෙකකට මුහුණ දුන්නේ ය. මෙම සංග්‍රාම දෙක ම යුරෝපයෙන් ආරම්භ වී සෙසු මහද්වීප කරා ද පැතිරිණ. ලෝකයේ බලවත් රටවල් රැසක් ම මෙම යුද්ධවලට සම්බන්ධ වූ නිසා එය ලෝක යුද්ධ වශයෙන් සලකනු ලැබේ. මෙම යුද්ධවලින් සිදු වූ දේපල විනාශය හා මනුෂ්‍ය ඝාතන අති විශාලය. ලෝක සංග්‍රාමවල අනිටු ප්‍රතිඵල නිසා ම, නැවත ලෝක සංග්‍රාමයක් ඇති වීම වළක්වා ගැනීම හා ලෝක සාමය සුරක්ෂිත කරගැනීම පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි අන්තර්ජාතික සංවිධාන බිහි විය. මෙම පාඩම් ඒකකයෙන් ලෝක සංග්‍රාමවලට තුඩු දුන් හේතු, ලෝක සංග්‍රාමවල ස්වභාවය හා ප්‍රතිඵල මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැදගත්කම පිළිබඳ ව අවධානය යොමු කෙරේ.

**නිපුණතාව**

- නූතන ලෝකයේ දේශපාලන ගැටුම්වල ස්වභාවය විමසා බලා එවැනි ගැටුම් පිටු දැකීම සඳහා ආකල්පමය පරිවර්තනය ඇති කර ගනියි

**නිපුණතා මට්ටම** 8.1 බලය පිළිබඳ ඇතිවන ගැටුම්වල විනාශකාරී බව විමසා බලයි

**කාලච්ඡේද සංඛ්‍යාව:**

**04 යි**

**ඉගෙනුම් පල**

- ලෝක සංග්‍රාම යනු කුමක්දැයි පැහැදිලි කරයි
- ලෝක සංග්‍රාමවලට හේතු විස්තර කරයි
- ලෝක සංග්‍රාමවල විනාශකාරීබව පෙන්වා දෙයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම් සැලසුම ගොඩගන්න

8.1.1 - **පළමු ලෝක මහා සංග්‍රාමය**

**සිදු වූ කාලවකවානුව** - 1914 ජුලි මස 28 දින සිට 1918 නොවැම්බර් 11 දින දක්වා

**පළමු ලෝක සංග්‍රාමයට බලපෑ හේතු :**

- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම
- ප්‍රංශය යුරෝපය තුළ තනි කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය
- ජර්මන් අධිරාජ්‍යයා වූ දෙවන විලියම්ගේ ක්‍රියාකලාපය
- යටත් විජිත සඳහා වූ තරඟය
- යුරෝපය පිල් දෙකකට බෙදීම
- ජාතීන් අතර ඇති වූ අවි තරඟය හා ජාතිවාදය වර්ධනය වීම
- ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු මරා දැමීම

**යුද්ධයේ පාර්ශවකරුවන්**

- මිත්‍ර පිලේ රටවල් - මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය
- මධ්‍යම බලවතුන්ගේ රටවල් - ජර්මනිය, ඔස්ට්‍රියාව, ඉතාලිය, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව

**පළමුවන ලෝක සංග්‍රාමයේ ව්‍යාප්තිය**

- ඔස්ට්‍රියාව විසින් සර්බියාව ආක්‍රමණය කිරීම
- ජර්මනිය රුසියාවට විරුද්ධව යුධ ප්‍රකාශ කිරීම
- බ්‍රිතාන්‍ය ජර්මනියට විරුද්ධව යුධ ප්‍රකාශ කිරීම
- යුරෝපා ජාතීන්ගේ යටත් විජිත කරා යුද්ධය පැතිරීම
- අමෙරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම

**පළමු ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල**

- මධ්‍යම බලවතුන් පරාජයට පත් වීම
- අතිවිශාල ජීවිත හා දේපල විනාශ වීම
- ජයග්‍රාහී රටවල් පරාජිත රටවල් හා ගිවිසුම් අත්සන් කරමින් එම රටවල්වලට දඬුවම් පැමිණ වීම උදා. : වර්සේල්ස් ගිවිසුම
- යුරෝපයේ පැවති ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටීම
- ලෝක බලවතුන් ලෙස අමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය නැගී ඒම
- ජාතීන්ගේ සංගමය පිහිටුවීම

**8.1.2 ජාතීන්ගේ සංගමය**

- ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීමට මුල් වූවෝ
- ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ මූලික අරමුණු
    - රටවල් අතර ඇතිවන වාදභේද සාමකාමීව විසඳීම
    - අනාගතයේ යුද්ධ ඇතිවීම වැලැක් වීම
    - ජාත්‍යන්තර අවබෝධය හා සහයෝගය ගොඩ නැගීම
    - කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කර දීම
    - විශ්ව සාමූහිකත්වය මගින් ලෝක සාමය ආරක්ෂා වීම

**ජාතීන්ගේ සංගමය සාමය සඳහා දැරූ ප්‍රයත්න**

- ස්වීඩනය හා පින්ලන්තය, ජර්මනිය හා පෝලන්තය, ග්‍රීසිය හා බල්ගේරියාව, ඉරානය හා තුර්කිය අතර ඇති වූ යුධ ගැටුම් වැලැක් වීම
- ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට පත් කර තිබූ යටත් විජිතවල පරිපාලන කටයුතු සාර්ථක ලෙස අධීක්ෂණය කිරීම
- සරණාගතයන් පුනරුත්තාපනය කිරීම
- නීති විරෝධී වහල් වෙළදාම හා මත්ද්‍රව්‍ය වෙළෙඳාම මර්දනය

**ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු**

- අමෙරිකා එක්සත් ජනපදය හා රුසියාව සංගමයට සම්බන්ධ නොවීම
- නිත්‍ය හමුදාවක් නොසිටීම
- මහා බලවතුන් අතර එකමුතුවක් නොතිබීම
- ලෝක සාමය කඩවූ ඇතැම් අවස්ථාවල එම රටවලට විරුද්ධව කටයුතු කිරීමට අපොහොසත් වීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණයවන පරිදි පොත් පිංචක් සකස් කිරීමට සිසුන් යොමු කරවන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පළමු ලෝක සංග්‍රාමය මාතෘකාව යටතේ ඇමුණුම 01හි සඳහන් අනු මාතෘකා වලට අදාල ව තොරතුරු ඇතුලත් කරමින් පොත් පිංච සැකසීමට උපදෙස් දෙන්න
- එය වඩාත් නිර්මාණශිලීව කරගැනීමට හා අදාල පින්තූර සිතියම් එකතු කිරීමට උපදෙස් දෙන්න
- පොත් පිංච සැකසීම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- සෑම ක්‍රියාකාරකමක්ම ඇගයීමට ලක් කරන්න
- සාර්ථක නිර්මාණ පන්තියේ සැමට කියවීමට අවස්ථාව ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- පළමු ලෝක යුද්ධය සම්බන්ධ ඡායාරූප, සිතියම්
- ඇමුණුම 01 - අනුමාතෘකා

- පළමු ලෝක යුද්ධය පිළිබඳ පහත මාතෘකා යටතේ පොත් පිංචක් සකස් කරන්න
    - පළමු ලෝක යුද්ධයට තුඩුදුන් හේතු
    - යුද්ධය ආරම්භය හා ව්‍යාප්තිය
    - යුද්ධයේ පාර්ශවකරුවන්
    - යුද්ධයේ ප්‍රතිඵල
    - ජාතීන්ගේ සංගමය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පළමු ලෝක සංග්‍රාමය පිළිබඳ විස්තර කරයි
- යුද්ධයේ බිහිසුණු බව පෙන්වා දෙයි
- අනු මාතෘකාවලට අදාල ව කරුණු ගොනු කරයි
- වඩාත් නිර්මාණශලී ව පොත් පිංච සකසයි
- නියමිත කාලයට භාරදෙයි

**නිපුණතා මට්ටම**

8.1 බලය පිළිබඳ ඇතිවන ගැටුම්වල විනාශකාරී බව විමසා බලයි

**කාලච්ඡේද සංඛ්‍යාව:**

**05 යි**

**ඉගෙනුම් පල**

- ලෝක සංග්‍රාමවලට හේතු විස්තර කරයි
- ලෝක සංග්‍රාමවල විනාශකාරී බව පෙන්වා දෙයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

දෙවන ලෝක සංග්‍රාමය පිළිබඳ පහත කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න

8.1.3 - **දෙවන ලෝක මහා සංග්‍රාමය**

**දෙවන ලෝක සංග්‍රාමය සිදු වූ කාලවකවානුව**

- 1939 සැප්තැම්බර් මස සිට 1945 අගෝස්තු දක්වා
  - **දෙවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු :**
    - ජර්මනියේ හිට්ලර් බලවත්වීම හා ඔහුගේ ක්‍රියාකලාපය
    - ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියාකලාපය
    - ජපානයේ ක්‍රියාකලාපය
    - ජාතීන්ගේ සංගමයේ දුර්වලතා

**යුද්ධයේ පාර්ශවකරුවන්**

- මිත්‍ර පක්ෂය - බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය
- අක්ෂ පක්ෂය - ජර්මනිය, ඉතාලිය, ජපානය

**යුද්ධය ලෝක සංග්‍රාමයක් දක්වා ව්‍යාප්ත වූ ආකාරය**

- ජර්මනියේ ආක්‍රමණකාරී පිළිවෙත
  (පෝලන්තය ආක්‍රමණය කිරීම හා යුද්ධය ඇරඹීම)
- ඉතාලියේ ආක්‍රමණකාරී පිළිවෙත
- බ්‍රිතාන්‍ය හා ප්‍රංශය ජර්මනියට විරුද්ධ වීම
- ජපානය ආසියාවේ අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීමේ ක්‍රියාකලාපය
- සෝවියට් රුසියාව හා අමෙරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම
- ජර්මනිය රුසියාව ආක්‍රමණය කිරීම
- ජර්මනිය යටත්වීම
- ජපානය යටත්වීම

- **දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල**
  - අක්ෂ පක්ෂය පරාජය වීම
  - ලොව මෙතෙක් ඇති වූ බිහිසුණුම සංග්‍රාමය වීම
  - හිරෝෂිමා, නාගසාකි පරමාණු බෝම්බවල විනාශකාරී බව ඉදිරි පරම්පරා තුළ ද දැකිය හැකි වීම

- බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි රටවල්වල ආර්ථික පරිහානය හා අමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් රුසියාව ලෝක බලවතුන් ලෙස නැගී ඒම
- යටත් විජිතවලට නිදහස ලැබීම
- සමාජවාදය හා ධනවාදය මුල් කරගනිමින් ලොව බල කඳවුරු දෙකක් ගොඩනැගීම
- නිරවි යුද්ධය

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වනසේ පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරවන්න**

**ක්‍රියාකාරකම 01**

- ඇමුණුම 01හි රූපය පන්තියට පෙන්වන්න
- එම රූපයෙන් දැක්වෙන යුද්ධයේ සංවේදී කථාව සිසුන්ට දන්වන්න
- ඒ අනුව දෙවන ලෝක යුද්ධයේ බිහිසුණු, කුරිරු බව පෙන්වා දෙමින් ''ලෝක සාමය සුරැකීමට දායක වෙමු'' මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් ලිවීමට සිසුන් යොමු කරන්න
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- දෙවන ලෝක යුද්ධයට අදාල පින්තූර ඇතුලත් කරමින් ලිපිය වඩා නිර්මාණශීලි ව සැකසීමට උපදෙස් දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබාදෙන්න
- සිසු නිර්මාණ ඇගයීමට ලක් කරන්න
- වඩාත් ගුණාත්මක හා නිර්මාණශිලී ක්‍රියාකාරකම් පන්තියේ සියලු දෙනාට ම කියවීමට අවස්ථාව ලබා දෙන්න

**ක්‍රියාකාරකම 02**

- ඇමුණුම 02 හි වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 02 වගුව හුණු පුවරුවේ සටහන් කරන්න
- කණ්ඩායම්වලට වගුව පන්තියේ ප්‍රදර්ශනය කළ හැකි අයුරින් (බ්‍රිස්ටල් බෝර්ඩ් හෝ ඒ හා සමාන කොලවල) සැකසීමට උපදෙස් දෙන්න
- කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෙන් වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- වගුව පන්තියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න
- සිසු ඉදිරිපත් කිරීම් හා ඌන පූර්ණ ඇතුලත් කරමින් හුණු පුවරුවේ වගුව සම්පූර්ණ කරන්න
- හුණු පුවරුවේ වගුව සිසු අභ්‍යාස පොතේ සටහන් කරගැනීමට අවස්ථාව ලබා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා එක් කාලපරිච්ඡේදයක් ලබා ගන්න

ගුණාත්මක යෙදවුම්

- ඇමුණුම 01



- දෙවන ලෝක සංග්‍රාම සමයේ හිට්ලර්ගේ නාසි හමුදාව ගමක් වටලා එහි සියලුදෙනා කඳවුරු ගතකර පසුව බොහෝ පිරිසක් මරා දමා ඇත. එහි දී මියගිය දරුවන් සිහි කිරීම පිණිස මෙම ස්මාරකය ගොඩනගා ඇත.
- ඒ ඒ වයසේ දරුවන් දුක්වන ස්වරූපය දෙමාපියන් අහිමිවීමේ කණගාටුව, බිය, අවිනිශ්චිතභාවය, කැටි වූ දුක්බර හැඟීම් කලාකරුවා විසින් ගොඩනගා ඇත.
- යුද්ධයට කිසිම දායකත්වයක් නොමැති මෙවැනි කුඩා දරුවන්ගේ ජීවිත විශාල සංඛ්‍යාවක් ලෝක යුද්ධ නිසා විනාශ විය
- ඒ අනුව යුද්ධයේ කුරිරු බව හා සාමයේ වැදගත්කමත් දෙවන ලෝක යුද්ධය ඇසුරින් පෙන්වා දෙමින් ලෝක සාමය සුරැකීමට දායක වෙමු'' මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් ලිවීමට සිසුන් යොමු කරන්න

**ඇමුණුම 02**

| දෙවන ලෝක සංග්‍රාමයට තුඩු දුන් හේතු | සහභාගි වූ රටවල් | එම රටවල් ලද ජයග්‍රහණ | සංග්‍රාමයේ ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිස්ටල් බෝඩ්
- පෙල්ට් පෑන්
- දෙවන ලෝක යුද්ධය පිළිබඳ ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විෂය අන්තර්ගතය පිළිබඳ දැනුම එහි ආකල්ප හා අදාළ ක්‍රියාකාරකම නිවැරදි ව සිදුකිරීම සහ ඉගෙනුම්පල මැනෙන සේ ඇගයීම් හා තක්සේරු නිර්ණායක සකස්කර ගනිමින් ලකුණු පවරන්න

**නිපුණතා මට්ටම**

8.2 ගැටුම් නිරාකරණයේ දී ජාත්‍යන්තර සාමය බිහිවීම පිළිබඳ විමසා බලයි

**කාලච්ඡේද සංඛ්‍යාව:**

**03 යි**

**ඉගෙනුම් පල**

- එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳ හඳුන්වයි
- ලෝක සාමය රැකගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දායකත්වය පෙන්වා දෙයි
- වර්තමාන ලෝක සාමය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ආවරණය වනසේ පාඩම සැලසුම් කරගන්න

**8.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය**

- එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මුල් වූවෝ
- 1945 ඔක්තෝබර් 24 දින එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය නිල වශයෙන් අනුමත වීම
- පිහිටුවීමේ අරමුණු
  * ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම
  * ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම
  * මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය සාක්ෂාත් කර ගැනීම

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය**

- මහා මණ්ඩලය
- ආරක්ෂක මණ්ඩලය
- ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳ මණ්ඩලය
- භාරකාර මණ්ඩලය
- ජාත්‍යන්තර අධිකරණය
- මහලේකම් කාර්යාලය

- **එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගත් ප්‍රයත්න**

- පරමාණුක බලශක්ති කොමිසම පිහිටුවීම
- විසඳූ අර්බුද
  * සුවස් අර්බුදය
  * ගල්ෆ් අර්බුදය
  * කියුබානු මිසයිල අර්බුදය

- **වර්තමාන ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග**
    - ආර්ථික සම්බාධක පැනවීම
    - න්‍යෂ්ටික අවි සීමා කිරීම හා පාලනය කිරීම
    - සාම සාධක හමුදාව යෙදවීම
    - වර්තමාන ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංගමයට ගත හැකි ක්‍රියාමාර්ග ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 01 හි සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරන්න
    - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
    - සුදුසු පරිදි කාලය ලබාදෙන්න
    - සිසු ක්‍රියාකාරකම් ඇගයීමට ලක්කරන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

- එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට හේතු පැහැදිලි කරන්න
- එක්සත් ජාතීන්ගේ සංගමයේ ව්‍යුහය පැහැදිලි කරන්න
- ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න
- වර්තමාන ලෝක සාමය ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ක්‍රියාකාරකමට අදාළ විෂය අන්තර්ගතය හා ඉගෙනුම්පල මැනෙන සේ ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක සකස් කර ගන්න